*සැ. යු.-* 2022.08.12 දින පළ කරන ලද අංක 2293 *ගැසට් පත්‍රයේ* IV (අ) කොටස පළ නොකරන ලදී.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,294 - 2022 අගෝස්තු මස 19 වැනි සිකුරාදා - 2022.08.19**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : I වැනි ඡෙදය - සාමාන්‍ය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)

| | පිටුව |
|---|---|
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය ... | — |
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | 1024 |
| අමාත්‍ය මණ්ඩලය විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | 1025 |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| වෙනත් පත්කිරීම් ආදිය ... ... ... | — |
| රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත්කිරීම් ආදිය ... ... ... | — |
| රජයේ නිවේදන ... ... ... | 1025 |
| මිල පාලන දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලංකා මහ බැංකුවේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලංකාණ්ඩුවේ ගිණුම් ප්‍රකාශන ... ... ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා ... ... ... | — |
| විවිධ දෙපාර්තමේන්තු දැන්වීම් ... ... ... | 1033 |
| නැවියන්ට දැන්වීම් ... ... ... | — |
| සුරාබදු ආඥාපනත පිළිබඳ දැන්වීම් ... ... ... | — |

*සැ. යු.* -(i) අධිකරණ සංවිධාන (සංශෝධන) පනත් කෙටුම්පත 2022 අගෝස්තු මස 05 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

(ii) සිවිල් නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත් කෙටුම්පත 2022 අගෝස්තු මස 05 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

(iii) පළාත්බද මහාධිකරණ (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත් කෙටුම්පත 2022 අගෝස්තු මස 05 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.**

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක්ම ගැසට් පත්‍රය පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2022 සැප්තැම්බර් මස 09 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2022 අගෝස්තු මස 26 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*''යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය.''*

2022 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

*මෙම ගැසට් පත්‍රය www. documents. gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

1023 B 082373— 403 (2022/08)
A 1-

# ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය

2022 අංක 549

MOD/DEF/HRM/04/SLN/RES/22 (22)

**ශ්‍රී ලංකා නාවික හමුදාව - නිත්‍ය නාවික බළකාය**

අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද
අධිකාරියෙන් ඉල්ලා අස්වීමක්

පහත නම සඳහන් නිලධාරියා 2022 ජුනි මස 24 වැනි දින සිට ශ්‍රී ලංකා නාවික හමුදා නිත්‍ය බළකායේ අධිකාරියෙන් ඉල්ලා අස්වීම අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කර ඇත.

ලුතිනන් කොමාණ්ඩර් (කිමි) අකිෂ අෂාන් දීනාරත්න, එන්ආර්එක්ස් 2437, ශ්‍රීලංනාහ

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

කමල් ගුණරත්න,
ඩබ්ඩබ්වී ආර්ඩබ්පී ආර්එස්පී යූඑස්පී එන්ඩීසී පීඑස්සී එම්ෆිල්,
ජෙනරල් (විශ්‍රාමික),
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2022 ජුනි මස 09 වැනි දින,
කොළඹ දී ය.

08 - 132/1

---

2022 අංක 550

MOD/DEF/HRM/04/SLN/RES/22 (20)

**ශ්‍රී ලංකා නාවික හමුදාව - නිත්‍ය නාවික බළකාය**

අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද
අධිකාරියෙන් ඉල්ලා අස්වීමක්

පහත නම සඳහන් නිලධාරියා 2022 අගෝස්තු මස 10 වැනි දින සිට ශ්‍රී ලංකා නාවික හමුදා නිත්‍ය බළකායේ අධිකාරියෙන් ඉල්ලා අස්වීම අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කර ඇත.

ලුතිනන් කොමාණ්ඩර් (තොතා) රන්හොටි බණ්ඩාරලාගේ වජිර මධුශංක ගුණවර්ධන, එන්ආර්ටී 3155, ශ්‍රීලංනාහ

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

කමල් ගුණරත්න,
ඩබ්ඩබ්වී ආර්ඩබ්පී ආර්එස්පී යූඑස්පී එන්ඩීසී පීඑස්සී එම්ෆිල්,
ජෙනරල් (විශ්‍රාමික),
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2022 ජුනි මස 09 වැනි දින,
කොළඹ දී ය.

08 - 132/2

---

2022 අංක 551

MOD/DEF/HRM/04/SLN/RES/22 (21)

**ශ්‍රී ලංකා නාවික හමුදාව - නිත්‍ය නාවික බළකාය**

අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද
අධිකාරියෙන් ඉල්ලා අස්වීමක්

පහත නම සඳහන් නිලධාරියා 2022 අගෝස්තු මස 15 වැනි දින සිට ශ්‍රී ලංකා නාවික හමුදා නිත්‍ය බළකායේ අධිකාරියෙන් ඉල්ලා අස්වීම අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කර ඇත.

තාවකාලික ලුතිනන් කොමාණ්ඩර් (සැ) නානායක්කාර කැප්පෙටිදුවගේ චමින්ද ගයාන් නානායක්කාර, එන්ආර්එස් 2927, ශ්‍රීලංනාහ

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

කමල් ගුණරත්න,
ඩබ්ඩබ්වී ආර්ඩබ්පී ආර්එස්පී යූඑස්පී එන්ඩීසී පීඑස්සී එම්ෆිල්,
ජෙනරල් (විශ්‍රාමික),
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2022 ජුනි මස 09 වැනි දින,
කොළඹ දී ය.

08 - 132/3

---

2022 අංක 552

MOD/DEF/HRM/04/SLN/COM/2022 (426-427)

**ශ්‍රී ලංකා නාවික හමුදාව - නිත්‍ය නාවික බළකාය**

අතිගරු ජනාධිපතිතුමන් විසින් අනුමත කරන ලද
අධිකාරියට පත් කිරීම්

*2022 අප්‍රේල් මස 06 වැනි දින සිට උප ලුතිනන් වශයෙන් :*

හේවා කට්ටාඩිගේ චතුරංග මධුසංඛ සංජීව, එන්ආර්එම් 4716, ශ්‍රීලංනාහ

*2022 අප්‍රේල් මස 06 වැනි දින සිට වැඩ බලන උප ලුතිනන් වශයෙන්:*

කරුණාමුනි ජනිත නිකේශන ප්‍රනාන්දු, එන්ආර්එම් 4717, ශ්‍රීලංනාහ

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

කමල් ගුණරත්න,
ඩබ්ඩබ්වී ආර්ඩබ්පී ආර්එස්පී යූඑස්පී එන්ඩීසී පීඑස්සී එම්ෆිල්,
ජෙනරල් (විශ්‍රාමික),
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2022 ජුනි මස 09 වැනි දින,
කොළඹ දී ය.

08 - 132/4

MOD/DEF/HRM/04/SLN/RES/22/(19)

**ශ්‍රී ලංකා නාවික හමුදාව - ස්වේච්ඡා නාවික බළකාය**

අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද අධිකාරියෙන් ඉවත් කිරීමක්

2022 අගෝස්තු මස 01 වැනි දින සිට ක්‍රියාත්මකවන පරිදි ශ්‍රී ලංකා ස්වේච්ඡා නාවික බළකායේ පහත නම සඳහන් නිලධාරියා අධිකාරියෙන් ඉවත් කිරීම අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කර ඇත.

ලුතිනන් (තොතා) ජයකොඩි ආරච්චිලාගේ දොන් නිපුණ තනුර, එන්වීටී 5841 ශ්‍රීලංස්වේනාහ

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

කමල් ගුණරත්න,
ඩබ්ඩබ්වී ආර්ඩබ්පී ආර්එස්පී යූඑස්පී එන්ඩීසී පීඑස්සී එම්ෆිල්,
ජෙනරාල් (විශ්‍රාමික),
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2022 ජුනි මස 09 වැනි දින,
කොළඹ දී ය.

08 - 132/5

## අමාත්‍ය මණ්ඩල පත්කිරීම්

2022 අංක 553

**පත්වීම**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 55 (2) ව්‍යවස්ථාවේ විධිවිධාන අනුව අමාත්‍ය මණ්ඩලය විසින් ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ විශේෂ ශ්‍රේණියේ නිලධාරිනි දීපිකා සෙනෙවිරත්න මහත්මිය 2022 ජුනි මස 17 දින සිට ක්‍රියාත්මකවන පරිදි, ආණ්ඩුවේ රස පරීක්ෂක තනතුරට පත් කර ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

අමාත්‍ය මණ්ඩලයේ නියමය පරිදි,

ඩබ්ලිව්. එම්. ඩී. ජේ. ප්‍රනාන්දු,
අමාත්‍ය මණ්ඩලයේ ලේකම්.

2022 අගෝස්තු මස 11 වැනි දින දී ය.

08-168

## රජයේ නිවේදන

**බොල්තුඹේ සමන් දේවාලයේ වාර්ෂික මහ පෙරහැර - 2022**

**පෙරහැර පවත්වන කාලසීමාව :**

1. 2022 වසරේ ඇසළ පෙරහැර සඳහා කප් සිටුවීම 2022.06.30 දින අළුයම සුබ මොහොතින් සිදු කරන ලදී.
   - 2022.08.24 වැනි දින උඩමළුවේ පෙරහැර ද,
   - 2022.09.05 වැනි දින මහ පෙරහැර ද,
   - 2022.09.10 වැනි දින අළුයම යෙදෙන සුබ මොහොතින් වලහුන් ඇල්ල මූකලාන දිය උල්පතේ දී දිය කැපීමේ මංගල්‍යයෙන් අනතුරුව පෙරහැර ගෙවදීමෙන් ඇසළ පෙරහැර මංගල්‍යය නිමා කිරීමට නියමිතය.

**කඳවුරු ප්‍රදේශය යනු :**

2. දේවාලයේ උතුරට පාර එම්. කේ. ලුවිස් සංඥෝ, එම්. කේ. පොඩිමහත්තයා යන අයගේ ඉඩම ද, නැගෙනහිරටඃ සිරිනිමල් හා එම්. කේ. විජේදාස යන අයගේ ඉඩම් ද, දකුණට : රංබණ්ඩාර මහතාගේ ගල්පඩිවත්ත යන ඉඩම ද, බස්නාහිරටඃ බී. එම්. විජේහාමි හා නෝබට් චින්තාමණී යන අයගේ ඉඩම් ද මායිම්ව පිහිටි භූමි භාගය පෙරහැර පවත්වන කඳවුරු ප්‍රදේශය වේ.

**ආහාර හා ජලය :**

3. විහාර මළුව, බෝධි මළුව හා දේවාල භූමිය යන ස්ථාන අවට භූමි භාගවල ආහාර පිසීම තහනම් කරමි.

**වෙළෙඳාම :**

4. උඩ මළුව තුළ, දඩු හැල තුළ, චෛත්‍යය මළුව තුළ, රථයේ මළුව හා විහාර මළුව තුළ සියලු වෙළෙඳාම් තහනම් කරමි.

5. පහළ වීදියේ දකුණු පැත්තට ප්‍රධාන ගල්පඩි පෙළ සිට සිංහාසන මන්දිරය දක්වා ගල්පඩි පෙළ නැගෙනහිර පැත්තෙන් නැටුම් කාමරය දක්වා පහළ වීදියේ දේවාලය දෙසට වන්නට රථගේ මළුව බැම්ම සිට චෛත්‍ය කොටස දක්වා ද මා විසින් නියම කරන ලද භූමිය ද නැවත රථගෙයි මළුවට නැගෙනහිරින් හා දකුණින් පහළ කොටස ද රථගෙයි

ඉදිරිපසින් දේවාලයට නැගෙනහිර සීමාවට ආසන්නව ද සියලු ආකාරයේ සාමාන්‍යයෙන් පවත්වාගෙන යනු ලබන, මවිසින් ලියාපදිංචි කර ඇති ස්ථිර වෙළෙඳසැල්වල හැර අනෙකුත් වෙළෙඳාම් කටයුතු සිදු කිරීම තහනම්ය.

6. ප්‍රාදේශීය ලේකම්ගේ බලයලත් නිලධාරියෙකුගේ අනුමැතියක් නොමැතිව කිසියම් තැනැත්තෙකු විසින් කඳවුරු ප්‍රදේශය තුළ ටිකට්පත්, කොඩි විකිණීම හෝ වෙනත් අන්දමක කුමන කාර්යයක් සඳහා හෝ මුදල් එකතු කිරීම නොකළ යුතු අතර, පෙරහැර පවත්වන කාල සීමාව තුළ එම භූමියේ සහ ඒ අවට දේවාල සීමාව තුළ දුම්කොළ ආශ්‍රිත නිෂ්පාදන හා සියලුම මත් ද්‍රව්‍ය විකිණීම හා භාවිතා කිරීම සම්පූර්ණයෙන් ම තහනම් කරමි.

**වාහන :**

7. ප්‍රධාන මාර්ගයේ පෞද්ගලික වාහන නතර කිරීම සම්පූර්ණයෙන්ම තහනම් කරමි. බයිසිකල් හා කරත්ත ඇතුළුව සියලුම රථ වාහන මාර්ග හෝ කඳවුරු භාර නිලධාරීතැනගේ බලපත්‍රයක් නොමැතිව කඳවුරු භූමිය තුළට ඇතුළු කිරීම තහනම් ය.

**සෞඛ්‍ය :**

8. යම් ආසාදන රෝගයකින් හෝ ස්පර්ශක රෝගයකින් පෙළෙන කිසිම තැනැත්තෙක් කඳවුරු පෙදෙස තුළට ඇතුළත් නොවිය යුතු අතර, රට තුළ බලපවත්වන වර්තමාන සෞඛ්‍ය උපදෙස්වලට, විශේෂයෙන්ම කොවිඩ් - 19 වසංගත තත්ත්වයට අදාළ සෞඛ්‍යාරක්ෂිත මාර්ගෝපදේශවලට අනුකූලව ක්‍රියා කිරීමට තරයේ වග බලාගත යුතු ය.

**ගොඩනැගිලි ඉදි කිරීම :**

9. මා ගෙන් ලබා ගත් අවසරයක් නොමැතිව කඳවුරු ප්‍රදේශයේ කිසිදු ගොඩනැගිල්ලක් ඉදි කිරීම හා අනවසර වෙළෙඳාම් කටයුතු තහනම්වන අතර, එසේ කටයුතු / ඉදි කිරීම් සෞඛ්‍ය අංශවල නිර්දේශවලට අනුව පොලීසිය විසින් ඉවත් කරනු ලැබේ.

**යාචකයෝ :**

10. සිඟමන් යැදීම හෝ පිනට ඉල්ලා ගැනීම සඳහා පූජා භූමිය තුළ හෝ, කඳවුරු පෙදෙස තුළ මුදලින් හෝ යම් වෙනත් ආකාරයකින් හෝ කිසිම තැනැත්තෙකු විසින් පිනට යමක් දීම හෝ පිනට යමක් බෙදා හැරීමට හෝ අවසර නොමැත.

ඩී. පී. ජී. රේණුකා,
ප්‍රාදේශීය ලේකම්,
ඉඹුල්පෙ.

08-131

---

## වන්දනා ගමන් ආඥාපනත

### ගලේවෙල ඓතිහාසික බම්බාව රජමහා විහාරස්ථානයේ වාර්ෂික ඇසළ මහා පෙරහැර

මාතලේ දිස්ත්‍රික්කයේ, ගලේවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ඓතිහාසික බම්බාව රජමහා විහාරස්ථානයේ, වාර්ෂික ඇසළ මහා පෙරහැර 2022 අගෝස්තු මස 25, 26 දිනවල පැවැත්වෙන බව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* පළකරන රෙගුලාසිවල දෙවැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

එම්. කේ. පී. ආරියරත්න,
ප්‍රාදේශීය ලේකම්,
ගලේවෙල.

08-138

---

*මගේ අංකය* : ආර්ජී/එන්බී/11/2/35/2022/පිටු/සැ.

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

### ඉඩම් ලියාපදිංචි කිරීමේ පොත්වල නැවත සකස් කළ පිටු පිළිබඳ (120 අධිකාරය) ආඥාපනත

01. මෙහි පහත උපලේඛනයෙහි දෙවැනි තීරුවේ සඳහන් ඉඩම් සහ තුන්වැනි තීරුවෙහි සඳහන් ඔප්පුවලට අදාළ පළමුවන තීරුවේ දැක්වෙන දැනට කැඩී බිඳී ගොස් ඇති ඉඩම් ලියාපදිංචි කළ පොත්/පිටුව නැවත සම්පූර්ණව, තාවකාලිකව සකස් කර ඇති බැව් ඉඩම් ලියාපදිංචි කළ පොත්වල නැවත සකස් කළ පිටු පිළිබඳ (120 අධිකාරය) ආඥාපනතේ 4 වැනි වගන්තිය අනුව මෙයින් දැනුම් දෙමි.

02. වර්ෂ **2022.08.19** වැනි දින සිට **2022.09.02** වැනි දින දක්වා සතියේ වැඩ කරන දිනවල පෙ.ව. 10.00 සිට ප. ව. 3.00 දක්වා ඕනෑම අයෙකුට ඉහත කී තාවකාලික පිටුව හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ දී පරීක්ෂාකර බැලිය හැකි ය.

03. එම තාවකාලික පිටුවේ කිසියම් හෝ එවැනි සටහනක අඩංගු යම් කරුණක් පිළිබඳව යම් විරුද්ධත්වයක් ප්‍රකාශ කර සිටීමට කැමති කෙනෙකු විසින් හෝ යම් සටහනක් හෝ යම්කිසි සටහනකින් අතහැර දමන ලද කරුණක් අඩංගු කරවා ගැනීමට ඉල්ලීමක් ඉදිරිපත් කිරීමට කැමති කෙනෙකු විසින් එකී විරුද්ධත්වය හෝ ඉල්ලීම අඩංගු ලියවිල්ලක් සවිස්තරාත්මකව පැහැදිලිව එය තහවුරු කෙරෙන ලියවිලි සමග **2022.09.09** වැනි දිනට පෙර මෙහි පහත අත්සන් කළ අයට ලැබෙන සේ රෙජිස්ට්‍රාර් ජනරාල් කාර්යාලය වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

පී. එස්. පී. අබේවර්ධන,
රෙජිස්ට්‍රාර් ජනරාල්,

රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව,
අංක 234/ඒ3,
ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
බත්තරමුල්ල.

**උපලේඛනය**

| *I වැනි තීරුව*<br>*ලියාපදිංචි පොත්වල කැඩී බිඳී ඇති පිටුවල විස්තර* | *II වැනි තීරුව*<br>*ඉඩම්වල විස්තර* | *III වැනි තීරුව*<br>*ලියාපදිංචි කළ ඔප්පුවල විස්තර* |
|---|---|---|
| කොළඹ දිස්ත්‍රික්කයේ, හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ජී කොට්ඨාසයේ, 258 වෙළුමේ 237 පත්‍රිරුව. | බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, පල්ලේ පත්තුවේ, හේවාගම් කෝරළේ, හෝකන්දර පිහිටි "අළුබෝගහවත්ත සහ ගොඩපරගහවත්තේ කොටස" නැමැති ඉඩම සඳහා මායිම්,<br><br>*උතුර* : මෙම ඉඩමේ කොටස,<br>*නැගෙනහිර* : පොල්ගහ වත්තගේ සුගතන්ට අයිති ඉඩම ද, සුසානා සිගේරාට හා තවත් අයට අයිති ඉඩම ද,<br>*දකුණ* : පොල්ගහ වත්තගේ සුගතන්ට අයිති ඉඩම ද,<br>*බස්නාහිර* : පාර ද.<br><br>බිම් ප්‍රමාණය : අ. 01 | 01. ඩී. වී. රණසිංහ ප්‍රසිද්ධ නොතාරිස් විසින් 1957.01.15 දින ලියා සහතික කරන ලද අංක 15335 දරන විකුණුම් ඔප්පුවයි.<br><br>02. ආර්. ඩී. විතාන ප්‍රසිද්ධ නොතාරිස් විසින් 1967.06.28 දින ලියා සහතික කරන ලද අංක 8237 දරන උකස් ඔප්පුවයි.<br><br>03. ඩබ්. එම්. පී. විජේසුන්දර ප්‍රසිද්ධ නොතාරිස් විසින් 1972.07.11 දින ලියා සහතික කරන ලද අංක 18391 දරන විකුණුම් ඔප්පුවයි.<br><br>04. ඩබ්. ආර්. එල්. ජී. විජේසුන්දර ප්‍රසිද්ධ නොතාරිස් විසින් 1994.12.21 දින ලියා සහතික කරන ලද අංක 2536 දරන විකුණුම් ඔප්පුවයි. |

08-157

---

*මගේ අංකය* : ආර්ජී/එන්බී/11/2/42/2022/පිටු/සෑ.

**රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව**

ඉඩම් ලියාපදිංචි කිරීමේ පොත්වල නැවත සකස් කළ පිටු පිළිබඳ (120 අධිකාරය) ආඥාපනත

01. මෙහි පහත උපලේඛනයෙහි දෙවැනි තීරුවේ සඳහන් ඉඩම් සහ තුන්වැනි තීරුවෙහි සඳහන් ඔප්පුවලට අදාළ පළමුවන තීරුවේ දැක්වෙන දැනට කැඩී බිඳී ගොස් ඇති ඉඩම් ලියාපදිංචි කළ පොත්/පිටුව නැවත සම්පූර්ණව, තාවකාලිකව සකස් කර ඇති බැව් ඉඩම් ලියාපදිංචි කළ පොත්වල නැවත සකස් කළ පිටු පිළිබඳ (120 අධිකාරය) ආඥාපනතේ 4 වැනි වගන්තිය අනුව මෙයින් දැනුම් දෙමි.

02. වර්ෂ **2022.08.19** වැනි දින සිට **2022.09.02** වැනි දින දක්වා සතියේ වැඩ කරන දිනවල පෙ.ව. 10.00 සිට ප. ව. 3.00 දක්වා ඕනෑම අයෙකුට ඉහත කී තාවකාලික පිටුව හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ දී පරීක්ෂාකර බැලිය හැකි ය.

03. එම තාවකාලික පිටුවේ කිසියම් හෝ එවැනි සටහනක අඩංගු යම් කරුණක් පිළිබඳව යම් විරුද්ධත්වයක් ප්‍රකාශ කර සිටීමට කැමති කෙනෙකු විසින් හෝ යම් සටහනක් හෝ යම්කිසි සටහනකින් අතහැර දමන ලද කරුණක් අඩංගු කරවා ගැනීමට ඉල්ලීමක් ඉදිරිපත් කිරීමට කැමති කෙනෙකු විසින් එකී විරුද්ධත්වය හෝ ඉල්ලීම අඩංගු ලියවිල්ලක් සවිස්තරාත්මකව පැහැදිලිව එය තහවුරු කෙරෙන ලියවිලි සමග **2022.09.09** වැනි දිනට පෙර මෙහි පහත අත්සන් කළ අයට ලැබෙන සේ රෙජිස්ට්‍රාර් ජනරාල් කාර්යාලය වෙත ලියාපදිංචි තැපැලෙන් එවිය යුතු ය.

පී. එස්. පී. අබේවර්ධන,
රෙජිස්ට්‍රාර් ජනරාල්,

රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව,
අංක 234/ඒ3,
ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
බත්තරමුල්ල.

**උපලේඛනය**

| *I වැනි තීරුව* *ලියාපදිංචි පොත්වල කැඩී බිඳී ඇති පිටුවල විස්තර* | *II වැනි තීරුව* *ඉඩම්වල විස්තර* | *III වැනි තීරුව* *ලියාපදිංචි කළ ඔප්පුවල විස්තර* |
|---|---|---|
| කොළඹ දිස්ත්‍රික්කයේ, හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ජී කොට්ඨාසයේ, 1374 වෙළුමේ 50 පත්ඉරුව. | බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, පල්ලේ පත්තුවේ, හේවාගම් කෝරළේ, කොට්ටාව පිහිටි "දාඹුගහවත්ත සහ ගොරකගහවත්ත *නොහොත්* මාවනත්ත" නැමති ඉඩමට ඩී. කපුගීකියන මිනින්දෝරු මහතාගේ අංක 5450 2002.04.21 දරන පිඹුරේ ඉඩම් කැබලි අංක බී සඳහා මායිම්,<br>*උතුර* : අඩි 10ක් පළල පාර,<br>*නැගෙනහිර* : අංක 5450 පිඹුරේ සී අක්ෂරය දරන කැබැල්ල,<br>*දකුණ* : ගමගේ දයාවතීට අයිති දේපළ,<br>*බස්නාහිර* : අංක 5450 පිඹුරේ ඒ අක්ෂරය දරන කැබැල්ල.<br>බිම් ප්‍රමාණය : පර්. 07.50 | 01. කේ. ඥානසිරි ප්‍රසිද්ධ නොතාරිස් විසින් 2002.06.01 දින ලියා සහතික කරන ලද අංක 9384 දරන තෑගි ඔප්පුව.<br>02. කේ. ඥානසිරි ප්‍රසිද්ධ නොතාරිස් විසින් 2006.05.27 දින ලියා සහතික කරන ලද අංක 13494 දරන ප්‍රකාශන ඔප්පුව.<br>03. කේ. ඥානසිරි ප්‍රසිද්ධ නොතාරිස් විසින් 2010.09.02 දින ලියා සහතික කරන ලද අංක 17296 දරන ප්‍රකාශන ඔප්පුව. |
| කොළඹ දිස්ත්‍රික්කයේ, හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ජී කොට්ඨාසයේ, 1374 වෙළුමේ 51 පත්ඉරුව. | බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, පල්ලේ පත්තුවේ, හේවාගම් කෝරළේ, කොට්ටාව පිහිටි "දාඹුගහවත්ත සහ ගොරකගහවත්ත *නොහොත්* මාවනත්ත" නැමති ඉඩමට ඩී. කපුගීකියන මිනින්දෝරු මහතාගේ අංක 5450 2002.04.21 දරන පිඹුරේ ඉඩම් කැබලි අංක ඩී සඳහා මායිම්,<br>*උතුර* : ලොට් සී වෙන්වන කාණුව,<br>*නැගෙනහිර* : බොරළුගොඩගේ පොඩිසිංඤෝට අයිති දේපළ,<br>*දකුණ* : මෙම ඉඩම වෙන්වන ලොට් ඊ දරන කාණුව,<br>*බස්නාහිර* : ලොට් එෆ්, ජී.<br>බිම් ප්‍රමාණය : පර්. 09.50 | 01. කේ. ඥානසිරි ප්‍රසිද්ධ නොතාරිස් විසින් 2002.06.01 දින ලියා සහතික කරන ලද අංක 9385 දරන තෑගි ඔප්පුව.<br>02. කේ. ඥානසිරි ප්‍රසිද්ධ නොතාරිස් විසින් 2006.05.27 දින ලියා සහතික කරන ලද අංක 13494 දරන ප්‍රකාශන ඔප්පුව.<br>03. කේ. ඥානසිරි ප්‍රසිද්ධ නොතාරිස් විසින් 2010.09.02 දින ලියා සහතික කරන ලද අංක 17296 දරන ප්‍රකාශන ඔප්පුව. |

08-158

*මගේ අංකය* : ආර්ජී/එන්බී/11/2/33/2020/පිටු/සැ.

**රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව**

ඉඩම් ලියාපදිංචි කිරීමේ පොත්වල නැවත සකස් කළ පිටු පිළිබඳ (120 අධිකාරය) ආඥාපනත

01. මෙහි පහත උපලේඛනයෙහි දෙවැනි තීරුවේ සඳහන් ඉඩම් සහ තුන්වැනි තීරුවෙහි සඳහන් ඔප්පුවලට අදාළ පළමුවන තීරුවේ දැක්වෙන දැනට කැඩී බිඳී ගොස් ඇති ඉඩම් ලියාපදිංචි කළ පොත්/පිටුව නැවත සම්පූර්ණව, තාවකාලිකව සකස් කර ඇති බැව් ඉඩම් ලියාපදිංචි කළ පොත්වල නැවත සකස් කළ පිටු පිළිබඳ (120 අධිකාරය) ආඥාපනතේ 4 වැනි වගන්තිය අනුව මෙයින් දැනුම් දෙමි.

02. වර්ෂ **2022.08.19** වැනි දින සිට **2022.09.02** වැනි දින දක්වා සතියේ වැඩ කරන දිනවල පෙ.ව. 10.00 සිට ප. ව. 3.00 දක්වා ඕනෑම අයෙකුට ඉහත කී තාවකාලික පිටුව දෙල්කඳ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ දී පරීක්ෂාකර බැලිය හැකි ය.

03. එම තාවකාලික පිටුවේ කිසියම් හෝ එවැනි සටහනක අඩංගු යම් කරුණක් පිළිබඳව යම් විරුද්ධත්වයක් ප්‍රකාශ කර සිටීමට කැමති කෙනෙකු විසින් හෝ යම් සටහනක් හෝ යම්කිසි සටහනකින් අතහැර දමන ලද කරුණක් අඩංගු කරවා ගැනීමට ඉල්ලීමක් ඉදිරිපත් කිරීමට කැමති කෙනෙකු විසින් එකී විරුද්ධත්වය හෝ ඉල්ලීම අඩංගු ලියවිල්ලක් සවිස්තරාත්මකව පැහැදිලිව එය තහවුරු කෙරෙන ලියවිලි සමග **2022.09.09** වැනි දිනට පෙර මෙහි පහත අත්සන් කළ අයට ලැබෙන සේ රෙජිස්ට්‍රාර් ජනරාල් කාර්යාලය වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

පී. එස්. පී. අබේවර්ධන,
රෙජිස්ට්‍රාර් ජනරාල්,

රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව,
අංක 234/ඒ3,
ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
බත්තරමුල්ල.

**උපලේඛනය**

| *I වැනි තීරුව* *ලියාපදිංචි පොත්වල කැඩී බිඳී ඇති පිටුවල විස්තර* | *II වැනි තීරුව* *ඉඩම්වල විස්තර* | *III වැනි තීරුව* *ලියාපදිංචි කළ ඔප්පුවල විස්තර* |
|---|---|---|
| කොළඹ දිස්ත්‍රික්කයේ, දෙල්කඳ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එම් කොට්ඨාසයේ, 2828 වෙළුමේ 07 පත්ඉරු. | බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, පල්ලේ පත්තුවේ, සල්පිටි කෝරළේ, හොන්නන්තර පිහිටි "හේනේගොඩවත්ත" නැමැති ඉඩමට බලයලත් මානක පී. ඩී. ජී. වීරසිංහ මහතා විසින් 2004.11.24 දින මැන සාදන ලද අංක 7366 දරන පිඹුරේ ලොට් 6A 2A සඳහා මායිම්,<br><br>*උතුර* : ලොට් 1A ,<br>*නැගෙනහිර* : ලොට් 6A , 2B ,<br>*දකුණ* : අඩිපාර හා 2131 දරන සිතියමේ කොටස,<br>*බස්නාහිර* : මෙම ඉඩමේ කොටසක්.<br><br>බිම් ප්‍රමාණය : පර්. 07 | 01. එම්. ඒ. වීරසිංහ ප්‍රසිද්ධ නොතාරිස් විසින් 2005.02.03 දින ලියා සහතික කරන ලද අංක 29506 දරන තෑගි ඔප්පුව. |

08-159

*මගේ අංකය* : ආර්ජී/එන්බී/11/2/06/2019/පිටු/සැ.

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

### ඉඩම් ලියාපදිංචි කිරීමේ පොත්වල නැවත සකස් කළ පිටු පිළිබඳ (120 අධිකාරය) ආඥාපනත

01. මෙහි පහත උපලේඛනයෙහි දෙවැනි තීරුවේ සඳහන් ඉඩම් සහ තුන්වැනි තීරුවෙහි සඳහන් ඔප්පුවලට අදාළ පළමුවන තීරුවේ දැක්වෙන දැනට කැඩී බිඳී ගොස් ඇති ඉඩම් ලියාපදිංචි කළ පොත්/පිටුව නැවත සම්පූර්ණව, තාවකාලිකව සකස් කර ඇති බැව් ඉඩම් ලියාපදිංචි කළ පොත්වල නැවත සකස් කළ පිටු පිළිබඳ (120 අධිකාරය) ආඥාපනතේ 4 වැනි වගන්තිය අනුව මෙයින් දැනුම් දෙමි.

02. වර්ෂ **2022.08.19** වැනි දින සිට **2022.09.02** වැනි දින දක්වා සතියේ වැඩ කරන දිනවල පෙ.ව. 10.00 සිට ප. ව. 3.00 දක්වා ඕනෑම අයෙකුට ඉහත කී තාවකාලික පිටුව දෙල්කඳ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ දී පරීක්ෂාකර බැලිය හැකි ය.

03. එම තාවකාලික පිටුවේ කිසියම් හෝ එවැනි සටහනක අඩංගු යම් කරුණක් පිළිබඳව යම් විරුද්ධත්වයක් ප්‍රකාශ කර සිටීමට කැමති කෙනෙකු විසින් හෝ යම් සටහනක් හෝ යම්කිසි සටහනකින් අතහැර දමන ලද කරුණක් අඩංගු කරවා ගැනීමට ඉල්ලීමක් ඉදිරිපත් කිරීමට කැමති කෙනෙකු විසින් එකී විරුද්ධත්වය හෝ ඉල්ලීම අඩංගු ලියවිල්ලක් සවිස්තරාත්මකව පැහැදිලිව එය තහවුරු කෙරෙන ලියවිලි සමග **2022.09.09** වැනි දිනට පෙර මෙහි පහත අත්සන් කළ අයට ලැබෙන සේ රෙජිස්ට්‍රාර් ජනරාල් කාර්යාලය වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

පී. එස්. පී. අබේවර්ධන,
රෙජිස්ට්‍රාර් ජනරාල්,

රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව,
අංක 234/ඒ3,
ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
බත්තරමුල්ල.

**උපලේඛනය**

| *I වැනි තීරුව* *ලියාපදිංචි පොත්වල කැඩී බිඳී ඇති පිටුවල විස්තර* | *II වැනි තීරුව* *ඉඩම්වල විස්තර* | *III වැනි තීරුව* *ලියාපදිංචි කළ ඔප්පුවල විස්තර* |
|---|---|---|
| කොළඹ දිස්ත්‍රික්කයේ, දෙල්කඳ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එම් කොට්ඨාසයේ, 744 වෙළුමේ 87 පත්ඉරුව. | බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, පල්ලේ පත්තුවේ, සල්පිටි කෝරළේ, පිටකෝට්ටේ පිහිටි මාරගහවත්ත, මාරග හවත්ත සහ තුන්හවුල් දෙල්ගහවත්ත නැමැති ඉඩමට අංක 427, 1963.01.22 දින මැන සාදන ලද ලොට් 1බී සඳහා මායිම්,<br>*උතුර* : ලොට් ඩී (පාරකට වෙන්කළ කොටස)<br>*නැගෙනහිර* : ලොට් 1සී සහ ව. අ. 389 ප්‍රධාන පාර කෝට්ටේ රෝමානු කතෝලික පල්ලිය.<br>*දකුණ* : ව. අ. 389 ප්‍රධාන පාර කෝට්ටේ රෝමානු කතෝලික පල්ලිය,<br>*බස්නාහිර* : ලොට් 1ඒ.<br>බිම් ප්‍රමාණය : පර්. 24.5 | 01. ඒ. බී. ඩබ්. ජයසේකර ප්‍රසිද්ධ නොතාරිස් විසින් 1963.07.16 දින ලියා සහතික කරන ලද අංක 2695 දරන විකුණුම් ඔප්පුව.<br>02. ඒ. බී. ඩබ්. ජයසේකර ප්‍රසිද්ධ නොතාරිස් විසින් 1991.04.05/ 1991.03.21, 22, 23 දින ලියා සහතික කරන ලද අංක 11061 දරන තෑගි ඔප්පුව. |

08-160

*මගේ අංකය* : ආර්ජී/එන්බී/11/2/34/2019/පිටු/සැ.

**රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව**

ඉඩම් ලියාපදිංචි කිරීමේ පොත්වල නැවත සකස් කළ පිටු පිළිබඳ (120 අධිකාරය) ආඥාපනත

01. මෙහි පහත උපලේඛනයෙහි දෙවැනි තීරුවේ සඳහන් ඉඩම් සහ තුන්වැනි තීරුවෙහි සඳහන් ඔප්පුවලට අදාළ පළමුවන තීරුවේ දැක්වෙන දැනට කැඩී බිඳී ගොස් ඇති ඉඩම් ලියාපදිංචි කළ පොත්/පිටුව නැවත සම්පූර්ණව, තාවකාලිකව සකස් කර ඇති බැව් ඉඩම් ලියාපදිංචි කළ පොත්වල නැවත සකස් කළ පිටු පිළිබඳ (120 අධිකාරය) ආඥාපනතේ 4 වැනි වගන්තිය අනුව මෙයින් දැනුම් දෙමි.

02. වර්ෂ **2022.08.19** වැනි දින සිට **2022.09.02** වැනි දින දක්වා සතියේ වැඩ කරන දිනවල පෙ.ව. 10.00 සිට ප. ව. 3.00 දක්වා ඕනෑම අයෙකුට ඉහත කී තාවකාලික පිටුව දෙල්කඳ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ දී පරීක්ෂාකර බැලිය හැකි ය.

03. එම තාවකාලික පිටුවේ කිසියම් හෝ එවැනි සටහනක අඩංගු යම් කරුණක් පිළිබඳව යම් විරුද්ධත්වයක් ප්‍රකාශ කර සිටීමට කැමති කෙනෙකු විසින් හෝ යම් සටහනක් හෝ යම්කිසි සටහනකින් අතහැර දමන ලද කරුණක් අඩංගු කරවා ගැනීමට ඉල්ලීමක් ඉදිරිපත් කිරීමට කැමති කෙනෙකු විසින් එකී විරුද්ධත්වය හෝ ඉල්ලීම අඩංගු ලියවිල්ලක් සවිස්තරාත්මකව පැහැදිලිව එය තහවුරු කෙරෙන ලියවිලි සමග **2022.09.09** වැනි දිනට පෙර මෙහි පහත අත්සන් කළ අයට ලැබෙන සේ රෙජිස්ට්‍රාර් ජනරාල් කාර්යාලය වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

පී. එස්. පී. අබේවර්ධන,
රෙජිස්ට්‍රාර් ජනරාල්,

රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව,
අංක 234/ඒ3,
ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
බත්තරමුල්ල.

*උපලේඛනය*

| *I වැනි තීරුව* *ලියාපදිංචි පොත්වල කැඩී බිඳී ඇති පිටුවල විස්තර* | *II වැනි තීරුව* *ඉඩම්වල විස්තර* | *III වැනි තීරුව* *ලියාපදිංචි කළ ඔප්පුවල විස්තර* |
|---|---|---|
| මාතර දිස්ත්‍රික්කයේ, කොටපොළ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ මාර/5/ප්‍ර/32844 පත්ඉරුව. | දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, පිට බැද්දර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයෙහි වැලිව ග්‍රාම සේවක කොට්ඨාසයේ, වැලිව පිහිටි ඉඩමට බලයලත් මානක විසින් මැන සාදන ලද අංක අ.ග.පි. 10 දරන පිඹුර සඳහා මායිම්,<br>*උතුර* : ඒ. එස්. ඒ. ජෝෂප්ගේ ඉඩම,<br>*නැගෙනහිර* : ළිඳගාවහේනවත්ත හා බිම්බිරිගස්වත්ත ඉඩම්,<br>*දකුණ* : වික්‍රමගේ තේමිස් පදිංචි ඉඩම,<br>*බස්නාහිර* : ළිඳගාව වත්ත.<br>බිම් ප්‍රමාණය : රූ.01, පර්. 35 | 01. ජනාධිපති ලේකම් විසින් 1996.03.05 දින ප්‍රදානය කරන ලද අංක මාර/5/ප්‍ර/32844 දරන දීමනා පත්‍රය. |

08-161

*මගේ අංකය* : ආර්ජී/එන්බී/11/2/22/2019/පිටු/සැ.

**රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව**

ඉඩම් ලියාපදිංචි කිරීමේ පොත්වල නැවත සකස් කළ පිටු පිළිබඳ (120 අධිකාරය) ආඥාපනත

01. මෙහි පහත උපලේඛනයෙහි දෙවැනි තීරුවේ සඳහන් ඉඩම් සහ තුන්වැනි තීරුවෙහි සඳහන් ඔප්පුවලට අදාළ පළමුවන තීරුවේ දැක්වෙන දැනට කැඩී බිඳී ගොස් ඇති ඉඩම් ලියාපදිංචි කළ පොත්/පිටුව නැවත සම්පූර්ණව, තාවකාලිකව සකස් කර ඇති බැව් ඉඩම් ලියාපදිංචි කළ පොත්වල නැවත සකස් කළ පිටු පිළිබඳ (120 අධිකාරය) ආඥාපනතේ 4 වැනි වගන්තිය අනුව මෙයින් දැනුම් දෙමි.

02. වර්ෂ **2022.08.19** වැනි දින සිට **2022.09.02** වැනි දින දක්වා සතියේ වැඩ කරන දිනවල පෙ.ව. 10.00 සිට ප. ව. 3.00 දක්වා ඕනෑම අයෙකුට ඉහත කී තාවකාලික පිටුව පානදුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ දී පරීක්ෂාකර බැලිය හැකි ය.

03. එම තාවකාලික පිටුවේ කිසියම් හෝ එවැනි සටහනක අඩංගු යම් කරුණක් පිළිබඳව යම් විරුද්ධත්වයක් ප්‍රකාශ කර සිටීමට කැමති කෙනෙකු විසින් හෝ යම් සටහනක් හෝ යම්කිසි සටහනකින් අතහැර දමන ලද කරුණක් අඩංගු කරවා ගැනීමට ඉල්ලීමක් ඉදිරිපත් කිරීමට කැමති කෙනෙකු විසින් එකී විරුද්ධත්වය හෝ ඉල්ලීම අඩංගු ලියවිල්ලක් සවිස්තරාත්මකව පැහැදිලිව එය තහවුරු කෙරෙන ලියවිලි සමග **2022.09.09** වැනි දිනට පෙර මෙහි පහත අත්සන් කළ අයට ලැබෙන සේ රෙජිස්ට්‍රාර් ජනරාල් කාර්යාලය වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

පී. එස්. පී. අබේවර්ධන,
රෙජිස්ට්‍රාර් ජනරාල්,

රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව,
අංක 234/ඒ3,
ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
බත්තරමුල්ල.

**උපලේඛනය**

| *I වැනි තීරුව*<br>*ලියාපදිංචි පොත්වල කැඩී බිඳී ඇති පිටුවල විස්තර* | *II වැනි තීරුව*<br>*ඉඩම්වල විස්තර* | *III වැනි තීරුව*<br>*ලියාපදිංචි කළ ඔප්පුවල විස්තර* |
|---|---|---|
| බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, පානදුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එෆ් කොට්ඨාසයේ 206 වෙළුමේ 73 පත්‍රිරුව. | බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, වෑකඩ, පානදුර තල්පිට දෙබැද්ද පිහිටි " කොන්ගහවත්තේ බී1 දරන කට්ටිය" නැමැති ඉඩමට බලයලත් මානක එල්. ඩබ්. එල්. ද සිල්වා මහතා විසින් 1989.06.03 දින මැන සාදන ලද අංක 7304 දරන පිඹුරේ ලොට් බී1බී සඳහා මායිම්,<br><br>*උතුර* : පී. එන්. රැදිගෝ මහත්මියට අයිති ඉඩම,<br>*නැගෙනහිර* : මෙම ඉඩමේ "සී" අකුර දරන කට්ටිය,<br>*දකුණ* : පාර,<br>*බස්නාහිර* : අංක 7304 දරන පිඹුරේ සඳහන් මෙම ඉඩමේ බී1ඒ දරන කට්ටිය.<br><br>බිම් ප්‍රමාණය : පර්. 20 | 01. ඩබ්. බී. සොයිසා ප්‍රසිද්ධ නොතාරිස් විසින් 1989.07.25 දින ලියා සහතික කරන ලද අංක 1196 දරන විකුණුම් ඔප්පුව.<br><br>02. ඩබ්. බී. සොයිසා ප්‍රසිද්ධ නොතාරිස් විසින් 1992.03.24 දින ලියා සහතික කරන ලද අංක 2963 දරන විකුණුම් ඔප්පුව. |

08-162

### කුරුණෑගල (වයඹ) කතෝලික රදගුරු පදවියේ කට්ටිමහන ශාන්ත ආනා ජාතික සිද්ධස්ථානයේ 127 වැනි වාර්ෂික මංගල්‍යය

ඉහත සඳහන් උත්සවය 2022 අගෝස්තු 18 දින ආරම්භ කර 2022 අගෝස්තු 29 වැනි දින අවසන් කරන බව සහ මංගල්‍ය උත්සවය 2022 අගෝස්තු මස 27, 28 යන දෙදින සිදු කරන බව මහජනතාවගේ දැන ගැනීම සඳහා මෙයින් නිවේදනය කරමි.

වන්දනා ගමන් ආඥාපනත යටතේ ප්‍රසිද්ධියට පත් කර ඇති රෙගුලාසි මෙම උත්සවය පැවැත්වෙන කාල සීමාව තුළ වලංගු වනවා ඇත.

නිලූකා ඩී. දසනායක,
ප්‍රාදේශීය ලේකම්,
උඩුබද්දාව.

2022 අගෝස්තු 15 වැනි දින සඳුදා,
උඩුබද්දාව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

08-166

## විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

### හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී - කිලිනොච්චි දකුණ ශාඛාව

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගන්නා ලද යෝජනා සම්මතයයි

වඩිවේල් ජෙරාල් ක්‍රිෂාන්ත සහ කඳන ආරච්චිගේ දෝන රංගා සුදර්ශනී

2022 මැයි මස 26 වැනි දින පවත්වන ලද හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමකදී පහත දැක්වෙන පරිදි විශේෂයෙන් හා ඒකමතිකව යෝජනා සම්මත කරගන්නා ලදී.

හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී විසින් වඩිවේල් ජෙරාල් ක්‍රිෂාන්ත සහ කඳන ආරච්චිගේ දෝන රංගා සුදර්ශනී වෙත ප්‍රදානය කරන ලද රු. 5,224,000.00 (රුපියල් මිලියන පහයි දෙලක්ෂ විසි හතර දහසක) නිවාස ණයක් ආපසු ගෙවීම සඳහා සුරක්ෂිතයක් වශයෙන් හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි වාසියට, යාපනයේ ප්‍රසිද්ධ නොතාරිස් ජේ. සිවරාමසමර් විසින් ලියා සහතික කරන ලද අංක 1243 හා 2016.06.19 දින දරන උකස් බැඳුම්කරය මගින් වඩිවේල් ජෙරාල් ක්‍රිෂාන්ත සහ කඳන ආරච්චිගේ දෝන රංගා සුදර්ශනී යන අය ණයකරුවන් වශයෙන් මෙහි උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇති දේපළ උකස්කර බැඳතබා තිබේ.

තව ද, වඩිවේල් ජෙරාල් ක්‍රිෂාන්ත සහ කඳන ආරච්චිගේ දෝන රංගා සුදර්ශනී යන අය විසින් එකී බැඳුම්කරය මත සහ එකී රු. 5,224,000.00ක නිවාස ණය මත හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙත අයවිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති අතර, ඒ අනුව දැන් එකී බැඳුම්කරය මත 2022 අප්‍රේල් 03 වැනි දිනට රු. 5,328,790.41 (රුපියල් මිලියන පහයි තුන් ලක්ෂ විසිඅට දහස් හත්සිය අනූවයි ශත හතලිස් එක) මුදලක් හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙත ලැබිය යුතුව සහ අයවිය යුතුව ඇති අතර, ඒ අනුව, මුදල් ලැබෙන තුරු කරන ලද ගෙවීම් (ඇත්නම්) ඒවා අඩුකොට, විකුණුම් දිනය දක්වා රු. 5,145,818.91ක ප්‍රාග්ධන හිඟය මත 2022 අප්‍රේල් 04 වැනි දින සිට වර්ෂයකට AWPLR + 3.5% (වර්ෂයකට 12.96%)ක අනුපාතයට තවදුරටත් පොළිය ද සමග එකී රු. 5,328,790.41ක මුදල සහ ප්‍රචාරණ පිරිවැය සහ දරන ලද අනෙකුත් ගාස්තු අයකරගැනීම සඳහා එකී අංක 1243 දින දරන බැඳුම්කරය මගින් හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙත උකස්කරන ලද සහ මෙහි දෙවන උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇති මාර්ග අයිතියද සමග මෙහි පළමුවන උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇති දේපළ, මුළු දිවයිනටම බලයලත් වෙන්දේසිකරු

අයි. ඩබ්. ජයසූරිය මගින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල යටතේ හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙමගින් යෝජනා සම්මත කරගනී.

### පළමුවන උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළේ, අධිකාරි පත්තුවේ, කැලණිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය සහ කැලණිය ප්‍රාදේශීය සභා පරිපාලන සීමාව තුළ කොට්ඨාශ අංක 04 හි තලවතුහේන්පිට බටහිර (261) ග්‍රාම නිලධාරි වසම තුළ වරහන්තුඩුව ගමේ පිහිටි වරිපනම් අංක 477/21/ඊ - නුවර පාර දරන "දෙල්ගහවත්ත" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ජේ. පී. එන්. ජයසුන්දර විසින් මැන සාදන ලද අංක 11538 හා 2016 මාර්තු මස 02 දින දරන පිඹුරේ ලොට් 6 (බලයලත් මිනින්දෝරු එල්. ජේ. ලියනගේ විසින් සාදන ලද අංක 10549 සහ 2007 පෙබරවාරි 26 දින දරන පිඹුරේ ලොට් ඩී1 නැවත මැන බෙදා වෙන්කිරීමක් වේ.) වශයෙන් ලකුණු කර ඇති බෙදාවෙන්කරන ලද ඉඩම් කොටසට මායිම් වශයෙන්, උතුරටඃ මෙහි ලොට් 7 (මාර්ගය සඳහා වෙන් කිරීම) ද, නැගෙනහිරටඃ මෙහි ලොට් 5 සහ එච්. ඩී. ජෝන් සිංඤෝගේ ඉඩම ද, දකුණට : එච්. ඩී. ජෝන් සිංඤෝගේ සහ කිංස්ලි විතානගේ සහ තවත් අයගේ ඉඩම ද සහ බස්නාහිරට : කිංස්ලි විතානගේ සහ තවත් අයගේ ඉඩම ද මායිම් වූ පර්චස් හය (පර්. 06)ක් හෝ හෙක්ටෙයාර් 0.0152ක් විශාලත්වයෙන් යුත් ඉඩම සහ පස, ගස්කොළ, වැවිලි සහ සෑම සියලු දේද සමග වේ. මෙය කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙළුම/පත්‍රිරුව ජී - 162/123 හි ලියාපදිංචි වී තිබේ.

### දෙවන උපලේඛනය

ඉහත කී වරහන්තුඩුව ගමේ පිහිටි "දෙල්ගහවත්ත" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ජේ. පී. එන්. ජයසුන්දර විසින් මැන සාදන ලද අංක 11538 හා 2016 මාර්තු මස 02 දින දරන පිඹුරේ ලොට් 7 (බලයලත් මිනින්දෝරු එල්. ජේ. ලියනගේ විසින් සාදන ලද අංක 10549 සහ 2007 පෙබරවාරි 26 දින දරන පිඹුරේ ලොට් ඩී 1 නැවත මැන බෙදා වෙන්කිරීමක් වේ) වශයෙන් ලකුණු කරන ඇති බෙදාවෙන්කරන ලද ඉඩම් කොටසට මායිම් වශයෙන්, උතුරට : මෙහි ලොට් 1,2,3 සහ 4 ද, නැගෙනහිරට : මෙහි ලොට් 4 සහ 5 ද, දකුණට : මෙහි ලොට් 5 සහ 6 ද සහ බස්නාහිරටඃ අඩි 12ක් පළල පාර සහ බදා ප්‍රියාවි සහ තවත් අයගේ ඉඩම ද මායිම් වූ පර්චස් තුනයි දශම බිංදුවයි හය (පර්. 3.06)ක් හෝ හෙක්ටෙයාර් 0.0077ක් විශාලත්වයෙන් යුත් ඉඩම වේ. මෙය කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙළුම/පත්‍රිරුව ජී - 162/122හි ලියාපදිංචි වී තිබේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි.

කේ. ඒ. එල්. ටී. රණවීර,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි
(නීති)/මාණ්ඩලික ලේකම්.

08 - 128/1

### හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී - නුගේගොඩ ශාඛාව

### 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගන්නා ලද යෝජනා සම්මතයයි

රාජපක්ෂ අප්පුහාමිලාගේ දොන් සුරේන්ද්‍ර වසන්ත පෙරේරා

2022 ජුනි මස 30 වැනි දින පවත්වන ලද හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමකදී පහත දැක්වෙන පරිදි විශේෂයෙන් හා ඒකමතිකව යෝජනා සම්මත කරගන්නා ලදී.

හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී විසින් රාජපක්ෂ අප්පුහාමිලාගේ දොන් සුරේන්ද්‍ර වසන්ත පෙරේරා වෙත ප්‍රදානය කරන ලද රු. 150,000,000.00ක වාරික ණයක් ආපසු ගෙවීම සඳහා සුරක්ෂිතයක් වශයෙන් හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි වාසියට, කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එම්. පී. එම්. මොහොට්ටි විසින් ලියා සහතික කරන ලද අංක 6996 හා 2017.07.25 දින දරන උකස් බැඳුම්කරය මගින් රාජපක්ෂ අප්පුහාමිලාගේ දොන් සුරේන්ද්‍ර වසන්ත පෙරේරා ණයකරු වශයෙන් මෙහි උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇති දේපළ උකස්කර බැඳතබා තිබේ.

තව ද, එකී රාජපක්ෂ අප්පුහාමිලාගේ දොන් සුරේන්ද්‍ර වසන්ත පෙරේරා යන අය විසින් එකී බැඳුම්කරය මත සහ රු. 150,000,000.00ක එකී වාරික ණය පහසුකම මත හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙත අයවිය යුතු මුදල් ගෙවීම පැහැර ඇති අතර, ඒ අනුව දැන් එකී බැඳුම්කරය මත 2022 මැයි 13 වැනි දිනට රුපියල් මිලියන හැත්තෑ හතරයි දෙලක්ෂ හතලිස් තුන් දහස් එකසිය හැට එකයි ශත විසි දෙක (රු. 74,243,161.22)ක මුදලක් පමණක් හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙත ලැබිය යුතුව සහ අයවිය යුතුව ඇති අතර, ඒ අනුව කරන ලද ගෙවීම් (ඇත්නම්) ඒවා අඩුකොට, විකුණුම් දිනය දක්වා රු. 42,000,000.00ක ප්‍රාග්ධන හිඟය මත 2022 මැයි 14 වැනි දින සිට වර්ෂයකට AWPLR + 2.5% (වර්ෂයට 13.56%)ක අනුපාතයට තවදුරටත් පොළිය ද සමග එකී රු. 74,243,161.22ක මුදල සහ ප්‍රචාරණ පිරිවැය සහ දරන ලද අනෙකුත් ගාස්තු අයකරගැනීම සඳහා එකී අංක 6996 දරන බැඳුම්කරය මගින් හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙත උකස්කරන ලද සහ මෙහි උපලේඛනයේ විස්තර කර ඇති දේපළ, මුළු දිවයිනටම බලයලත් වෙන්දේසිකරු කේ. පී. එන්. සිල්වා මගින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල

යටතේ හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙමගින් යෝජනා සම්මත කරගනී.

### උපලේඛනය

මධ්‍යම පළාතේ, නුවරඑළිය දිස්ත්‍රික්කයේ, නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය සහ නුවරඑළිය මහනගර සභා සීමාව තුළ 09 - නුවරඑළිය ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ අංක 18, යුනික් වීව් පාරේ පිහිටි "සනී හිල් ටුවර් ඉන්" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු යූ. එන්. පී. විජේවීර විසින් සාදන ලද අංක 2050 හා 1993.06.12 දින දරන පිඹුරේ දැක්වෙන බෙදා වෙන්කරන ලද ඉඩම් කොටසට මායිම් වශයෙන්, උතුරට : රණසිංහ මාවත ද, නැගෙනහිරට : මෙම ඉඩමේම ඉතිරි කොටස ද, දකුණට : යුනික් වීව් පාර සහ බස්නාහිරට : යුනික් වීව් පාර ද මායිම් වූ එකී අංක 2050 දරන පිඹුර ප්‍රකාරව පර්චස් විසි අටක් (පර්. 28) (හෙක්ටෙයාර් 0.0706) විශාලත්වයෙන් යුත් ඉඩම සහ ඒ තුළ පිහිටි ගොඩනැගිලි ඇතුළු සෑම සියලු දේද වේ. මෙය නුවරඑළිය දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ හිමිකම ඒ 37/294 යටතේ ලියාපදිංචි වී තිබේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි.

කේ. ඒ. එල්. ටී. රණවීර,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි
(නීති)/මාණ්ඩලික ලේකම්.

08 - 128/2

---

### හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී - නුගේගොඩ ශාඛාව

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගන්නා ලද යෝජනා සම්මතයයි

රාජපක්ෂ අප්පුහාමිලාගේ දොන් සුරේන්ද්‍ර වසන්ත පෙරේරා

2022 ජූනි මස 30 වැනි දින පවත්වන ලද හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමකදී පහත දැක්වෙන පරිදි විශේෂයෙන් හා ඒකමතිකව යෝජනා සම්මත කරගන්නා ලදී.

හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී විසින් රාජපක්ෂ අප්පුහාමිලාගේ දොන් සුරේන්ද්‍ර වසන්ත පෙරේරා වෙත ප්‍රදානය කරන ලද රු. 50,000,000.00ක වාරික ණය සහ රු. 100,000,000.00ක ස්ථාවර අයිරාව ආපසු ගෙවීම සඳහා සුරක්ෂිතයක් වශයෙන් හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි වාසියට, කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එම්. පී. එම්. මොහොට්ටි විසින් සියල්ල ලියා සහතික කරන ලද අංක 6457 හා 2016.04.08 දින දරන, අංක 6997 හා 2017.07.25 දින දරන සහ අංක 7494 හා 2018.12.06 දින දරන උකස් බැඳුම්කර මගින් රාජපක්ෂ අප්පුහාමිලාගේ දොන් සුරේන්ද්‍ර වසන්ත පෙරේරා ණයකරු වශයෙන් මෙහි උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇති දේපළ උකස්කර බැඳතබා තිබේ.

තව ද, එකී රාජපක්ෂ අප්පුහාමිලාගේ දොන් සුරේන්ද්‍ර වසන්ත පෙරේරා යන අය විසින් එකී බැඳුම්කර මත සහ එකී රු. 50,000,000.00ක එක වාරික ණය සහ රු. 100,000.000.00ක ස්ථාවර අයිරාව මත හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙත අයවිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති අතර, ඒ අනුව දැන් එකී බැඳුම්කර මත 2022 මැයි 13 වැනි දිනට පිළිවෙලින් රු. 45,818,532.89 හා 166,007,188.65ක් එකතුව රුපියල් මිලියන දෙසිය එකොළහයි අට ලක්ෂ විසිපන් දහස් හත්සිය විසි එකයි ශත පනස් හතර (රු. 211,825,721.54)ක මුදලක් පමණක් හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙත ලැබිය යුතුව සහ අයවිය යුතුව ඇති අතර, ඒ අනුව කරන ලද ගෙවීම් (ඇත්නම්) ඒවා අඩුකොට, විකුණුම් දිනය දක්වා එකී වාරික ණය මත රු. 28,294,363.23.ක ප්‍රාග්ධන හිඟය මත 2022 මැයි 14 වැනි දින සිට වර්ෂයකට AWPLR + 2.5% (වර්ෂයකට 13.56%)ක අනුපාතයට තවදුරටත් පොළිය ද සමග පිළිවෙලින් රු. 45,818,532.89 හා එකී රු. 166,007,188.65ක මුදල සහ ප්‍රචාරණ පිරිවැය සහ දරන ලද අනෙකුත් ගාස්තු සමග අයකරගැනීම සඳහා එකී අංක 6457 හා 7494 දරන බැඳුම්කර මගින් හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙත උකස්කරන ලද සහ මෙහි උපලේඛනයේ විස්තර කර ඇති දේපළ, මුළු දිවයිනටම බලයලත් වෙන්දේසිකරු කේ. පී. එන්. සිල්වා මගින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල යටතේ හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙමගින් යෝජනා සම්මත කරගනී.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය සහ කොළඹ මහනගර සභා සීමාව තුළ අංක 36හි කුරුඳුවත්ත ග්‍රාම නිලධාරි වසම තුළ වරිපනම් අංක 2සී, සුකුස්ටාන් ගාඩ්න් දරන කුරුඳුවත්තේ සුකුස්ටාන් ගාඩ්න් දිගේ පිහිටි සුකුස්ටාන් ගාඩ්න් නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු කේ. කනගසිංහම් විසින් සාදන ලද අංක 4421 හා 2015 ජූලි 30 දින දරන පිඹුරේ ලොට් කියු වශයෙන් ලකුණු කරන ලද බෙදා

වෙන්කරන ලද ඉඩම් කොටසට මායිම් වශයෙන්, උතුරට : එකී අංක 10153ඒ දරන මානක පිඹුරේ ලොට් එම් සහ වරිපනම් අංක 2බී - සුකුස්ටාන් ගාඩ්න් දරන බලයලත් මිනින්දෝරු පී. සින්නතම්බි විසින් සාදන ලද අංක 2649 හා 1990 පෙබරවාරි 07 දින දරන මානක පිඹුරේ ලොට් 3 ද, නැගෙනහිරට : සුකුස්ටාන් ගාඩ්න්, එකී අංක 2015 දරන මානක පිඹුරේ ලොට් එක්ස් 5 (මීටර් 3.05 (අඩි 10ක් පළල) අනුමත කරන ලද පුද්ගලික පාර) සහ වරිපනම් අංක 2ඩී - සුකුස්ටාන් ගාඩ්න් දරන බලයලත් මිනින්දෝරු පී. සින්නතම්බි විසින් සාදන ලද අංක 2649 හා 1990 පෙබරවාරි 07 දින දරන මානක පිඹුරේ ලොට් 6 සහ 5 ද, දකුණට : එකී අංක 2015 දරන මානක පිඹුරේ ලොට් එක්ස්5 (මීටර් 3.05 (අඩි 10ක් පළල) අනුමත කරන ලද පුද්ගලික පාර) සහ වරිපනම් අංක 2ඩී සුකුස්ටාන් ගාඩ්න් දරන බලයලත් මිනින්දෝරු පී. සින්නතම්බි විසින් සාදන ලද අංක 2649 හා 1990 පෙබරවාරි 07 දින දරන මානක පිඹුරේ ලොට් 5 සහ බස්නාහිරට : වරිපනම් අංක 2ඩී - සුකුස්ටාන් ගාඩ්න් දරන බලයලත් මිනින්දෝරු පී. සින්නතම්බි විසින් සාදන ලද අංක 2649 හා 1990 පෙබරවාරි 07 දින දරන මානක පිඹුරේ ලොට් 5 සහ වරිපනම් අංක 18 - වෝඩ් පෙදෙස දරන තියන්ගනීවසම් ද මායිම් වූ එකී අංක 4421 දරන පිඹුර ප්‍රකාරව පර්චස් දහයයි දශම අටයි තුනක් (පර්. 10.83) විශාලත්වයෙන් යුත් ඉඩම.

බලයලත් මිනින්දෝරු පී. සින්නතම්බි විසින් සාදන ලද අංක 2015 හා 1988 මැයි 16 දින දරන පිඹුරේ ලොට් එක්ස් 5 මතින් හා ඒ දිගේ වන මාර්ග අයිතිය ද සමග වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි.

කේ. ඒ. එල්. ටී. රණවීර,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි
(නීති)/මාණ්ඩලික ලේකම්.

08 - 128/3

---

## හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී - දන්කොටුව ශාඛාව

### 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගන්නා ලද යෝජනා සම්මතයයි

අදික්කාලම් ඇන්තනි සෙල්වරන්ජන්

2022 ජූනි මස 30 වැනි දින පවත්වන ලද හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමකදී පහත දැක්වෙන පරිදි විශේෂයෙන් හා ඒකමතිකව යෝජනා සම්මත කරගන්නා ලදී.

හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී විසින් අදික්කාලම් ඇන්තනි සෙල්වරන්ජන් වෙත ප්‍රදානය කරන ලද රු. 10,785,000.00ක ප්‍රතිව්‍යුහගත කරන ලද සංවර්ධන ණය පහසුකම ආපසු ගෙවීම සඳහා සුරක්ෂිතයක් වශයෙන් හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි වාසියට, මාරවිල ප්‍රසිද්ධ නොතාරිස් එච්. ජේ. එම්. ඩී. ජයසිංහ විසින් සියල්ල ලියා සහතික කරන ලද අංක 17348 හා 2008.03.31 දින දරන අංක 20617 හා 2011.09.15 දින දරන, අංක 22631 හා 2014.03.18 දින දරන, අංක 23352 හා 2015.06.01 දින දරන, අංක 24131 හා 2016.08.04 දින දරන, අංක 24553 හා 2017.05.03 දින දරන සහ අංක 25252 හා 2018.10.12 දින දරන උකස් බැඳුම්කර මගින් අදික්කාලම් ඇන්තනි සෙල්වරන්ජන් ණයකරු වශයෙන් මෙහි උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇති දේපළ උකස්කර බැඳතබා තිබේ.

තව ද, එකී අදික්කාලම් ඇන්තනි සෙල්වරන්ජන් යන අය විසින් එකී බැඳුම්කර මත සහ අනිකුත් පහසුකම් අතර ඔබ වෙත ප්‍රදානය කරන ලද රු. 10,785,000.00ක එකී ප්‍රතිව්‍යුහගත කරන ලද ණය පහසුකම මත හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙත අයවිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති අතර, ඒ අනුව දැන් එකී බැඳුම්කර මත 2022 අප්‍රේල් 29 වැනි දිනට රුපියල් මිලියන එකොළහයි තුන් ලක්ෂ දහහත් දහස් පන්සිය තිස් දෙකයි ශත තිස් තුන (රු. 11,317,532.33)ක මුදලක් පමණක් හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙත ලැබිය යුතුව සහ අයවිය යුතුව ඇති අතර, ඒ අනුව එතෙක් කරන ලද ගෙවීම් (ඇත්නම්) ඒවා අඩුකොට, විකුණුම් දිනය දක්වා රු. 10,768,844.78ක ප්‍රාග්ධන හිඟය මත 2022 අප්‍රේල් 30 වැනි දින සිට වර්ෂයකට 15% ක අනුපාතයට තවදුරටත් පොළිය ද සමග එකී රු.11,317,532.33ක මුදල සහ ප්‍රචාරණ පිරිවැය සහ දරන ලද අනෙකුත් ගාස්තු ද සමග අයකරගැනීම සඳහා එකී අංක 17348, 20617, 22631, 23352, 24131, 24553 සහ 25252 දරන බැඳුම්කර මගින් හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙත උකස්කරන ලද සහ මෙහි උපලේඛනයේ විස්තර කර ඇති දේපළ, මුළු දිවයිනටම බලයලත් වෙන්දේසිකරු එල්. බී. සේනානායක මගින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල යටතේ හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙමගින් යෝජනා සම්මත කරගනී.

### උපලේඛනය

වයඹ පළාතේ, පුත්තලම දිස්ත්‍රික්කයේ, මාරවිල ඉඩම් ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ, දකුණු පිටිගල් කෝරළේ කම්මල් පත්තුවේ, වෙන්නප්පුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය

සහ ප්‍රාදේශීය සභා සීමාව තුළ තඹරවිල ග්‍රාමනිලධාරි වසම තුළ තඹරවිල පිහිටි "බෝගහවත්ත" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ඩබ්. ජේ. එම්. ජී. ඩයස් විසින් සාදන ලද අංක 614/85 හා 1985 ඔක්තෝබර් 07 දින දරන පිඹුරේ ලොට් 1 වශයෙන් ලකුණු කරන ලද ඉඩමෙන් බෙදා වෙන්කරන ලද කොටසක් වන, බලයලත් මිනින්දෝරු ඩබ්. ජේ. එම්. ජී. ඩයස් විසින් සාදන ලද අංක 2261 සී/96 හා 1996 ජූලි 08 දින දරන පිඹුරේ දක්වා ඇති බෙදා වෙන්කරන ලද ඉඩම් කොටසට (මායිම් සහ ප්‍රමාණය ඉහත කී මිනින්දෝරු විසින් 2007 නොවැම්බර් 06 වැනි දින පරීක්ෂා කරන ලද අතර, එය නිවැරදි බවට සොයාගන්නා ලදී.) මායිම් වශයෙන්, උතුරට : ඉහත කී අංක 614/85 දරන පිඹුරේ ලොට් 02 ද, නැගෙනහිරට : ඉහත කී අංක 614/85 දරන පිඹුරේ ලොට් 01හි ඉතිරි කොටස ද, දකුණට: තෝප්පුව සිට දන්කොටුව දක්වා දිවෙන මහා මාර්ගය සහ බස්නාහිරට : පාර ද මායිම් වූ පර්චස් දහයක් (පර්. 10) විශාලත්වයෙන් යුත් ඉඩම වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි.

කේ. ඒ. එල්. ටී. රණවීර,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී
(නීති)/මාණ්ඩලික ලේකම්.

08 - 128/4

---

## හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී - ඇඹිලිපිටිය ශාඛාව

### 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගන්නා ලද යෝජනා සම්මතයයි

ජාසින් පතිරනගේ ආනන්ද

2022 ජූනි මස 30 වැනි දින පවත්වන ලද හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමකදී පහත දැක්වෙන පරිදි විශේෂයෙන් හා ඒකමතිකව යෝජනා සම්මත කරගන්නා ලදී.

හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී විසින් ජාසින් පතිරනගේ ආනන්ද වෙත ප්‍රදානය කරන ලද රු. 9,800,000.00ක සංවර්ධන ණය පහසුකමක් ආපසු ගෙවීම සඳහා සුරක්ෂිතයක් වශයෙන් හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි වාසියට, ඇඹිලිපිටිය ප්‍රසිද්ධ නොතාරිස් ආර්. එම්. සී. ආර්. බී. රාජපක්ෂ විසින් දෙකම ලියා සහතික කරන ලද රු. 5,040,000.00ක් සඳහා වන අංක 4030 හා 2017.02.27 දින දරන සහ රු. 10,000,000.00ක් සඳහා වන අංක 4219 හා 2017.09.29 දින දරන උකස් බැඳුම්කර මගින් රු. 15,040,000.00ක සම්පූර්ණ මුදලක් සඳහා ජාසින් පතිරනගේ ආනන්ද විසින් ණයකරු වශයෙන් මෙහි පළමුවන උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇති දේපළ උකස්කර බැඳතබා තිබේ.

තව ද, හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී විසින් ජාසින් පතිරනගේ ආනන්ද වෙත ප්‍රදානය කරන ලද ඉහත කී රු. 9,800,000.00ක සංවර්ධන ණය පහසුකම ආපසු ගෙවීම සඳහා සුරක්ෂිතයක් වශයෙන් හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි වාසියට, ඇඹිලිපිටිය ප්‍රසිද්ධ නොතාරිස් ආර්. එම්. සී. ආර්. බී. රාජපක්ෂ විසින් ලියා සහතික කරන ලද රු. 1,960,000.00ක් සඳහා වන අංක 4031 හා 2017.02.27 දින දරන උකස් බැඳුම්කරය මගින් ජාසින් පතිරනගේ ආනන්ද විසින් ණයකරු වශයෙන් මෙහි දෙවන උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇති දේපළ උකස්කර බැඳතබා තිබේ.

තව ද, එකී ජාසින් පතිරනගේ ආනන්ද යන අය විසින් එකී බැඳුම්කර මත සහ රු. 9,800,000.00ක එකී සංවර්ධන ණය පහසුකම් මත හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙත අයවිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති අතර, ඒ අනුව දැන් එකී බැඳුම්කර මත 2022 මාර්තු මස 31 වැනි දිනට රුපියල් මිලියන දහයයි එක් ලක්ෂ හැත්තෑ හය දහස් අටසිය දොළහයි ශත දොළහ (රු. 10,176,812.12)ක මුදලක් පමණක් හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙත ලැබිය යුතුව සහ අයවිය යුතුව ඇති අතර, ඒ අනුව මුදල් ලැබෙනතුරු කරන ලද ගෙවීම් (ඇත්නම්) ඒවා අඩුකොට, විකුණුම් දිනය දක්වා රු. 9,800,000.00 ක ප්‍රාග්ධන හිඟය මත 2022 අප්‍රේල් 01 වැනි දින සිට වර්ෂයකට AWPLR+ 3.5%ක අනුපාතයට තවදුරටත් පොළිය ද සමග එකී රු. 10,176,812.12ක මුදල සහ ප්‍රචාරණ පිරිවැය සහ දරන ලද අනෙකුත් ගාස්තු ද සමග අයකරගැනීම සඳහා එකී අංක 4030, 4219 සහ 4031 දරන බැඳුම්කර මගින් හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙත උකස්කරන ලද සහ මෙහි ඉහත කී උපලේඛනවල විස්තර කර ඇති දේපළ, මුළු දිවයිනටම බලයලත් වෙන්දේසිකරු ජේ. ඩබ්. ඊ. ජයවර්ධන මගින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල යටතේ හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙමගින් යෝජනා සම්මත කරගනී.

### පළමුවන උපලේඛනය

සබරගමුව පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, කොලොන්න කෝරළේ, දියපොතගම් පත්තුවේ, ඇඹිලිපිටිය ප්‍රාදේශීය ලේකම්

කොට්ඨාසය සහ ඇඹිලිපිටිය ප්‍රාදේශීය සභා සීමාව තුළ හිඟුර ග්‍රාම නිලධාරී වසම තුළ හිඟුර පිහිටි "දන්ගරසියඹලාගහයාය (කොටස)" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එස්. රාමක්‍රිෂ්නන් විසින් සාදන ලද අංක 3626/11 හා 2011.03.23 දින දරන පිඹුරේ ලොට් ඒ වශයෙන් ලකුණු කර ඇති බෙදා වෙන්කරන ලද ඉඩම් කොටසට මායිම් වශයෙන්, උතුරට : වෙල්ලපිල්ලෙයි ආරච්චිගේ සිරිසේන හිමිකම්පාන ඉඩම ද, නැගෙනහිරට : ප්‍රධාන පාර (නෝනාගම සිට ඇඹිලිපිටිය දක්වා) ද, දකුණට : විදානගමගේ දහනායක හිමිකම්පාන ඉඩම සහ බස්නාහිරට : විදානගේ පියදාස හිමිකම්පාන ඉඩම ද මායිම් වූ පර්චස් විස්සයි දශම හතයි දෙක (පර්. 20.72) විශාලත්වයෙන් යුත් ඉඩම සහ ඒ තුළ පිහිටි ගොඩනැගිලි ඇතුළු සෑම සියලු දේද සමග වේ. මෙය ඇඹිලිපිටිය දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ හිමිකම එල් 115/10 යටතේ ලියාපදිංචි වී තිබේ.

### දෙවන උපලේඛනය

සබරගමුව පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, කොලොන්න කෝරළේ, දියපොතගම් පත්තුවේ, ඇඹිලිපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය සහ ඇඹිලිපිටිය නගර සභා සීමාව තුළ හිඟුරආර ග්‍රාම නිලධාරී වසම තුළ ඇඹිලිපිටිය උදාගම ගමේ පිහිටි "මහකුඹුකේහේන කොටසක්" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු රන්දතිස්ස කොටඹගේ විසින් සාදන ලද අංක 3/6 වඩාත් නිවැරදිව 316 හා 2005.08.16 දින දරන පිඹුරේ ලොට් ඒ වශයෙන් ලකුණු කර ඇති බෙදා වෙන්කරන ලද ඉඩම් කොටසට මායිම් වශයෙන්, උතුරට : ආර්. ආර්. පියසේන හිමිකම්පාන දේපළ ද, නැගෙනහිරට : දහනායක බේබිහාමි හිමිකම්පාන දේපළ නමුත් වඩාත් නිවැරදිව දහනායකගේ බේබිහාමි හිමිකම්පාන දේපළ සහ පාර ද, දකුණට : මෙම ඉඩමේම කොටසක් සහ පාර සහ බස්නාහිරට : ආර්. ආර්. පියසේන හිමිකම්පාන දේපළ වඩාත් නිවැරදිව ආර්. ආර්. ප්‍රියන්ත හිමිකම්පාන දේපළ ද මායිම් වූ පර්චස් දහනමයක් (පර්. 19) විශාලත්වයෙන් යුත් ඉඩම සහ ඒ තුළ පිහිටි ගොඩනැගිලි ඇතුළු සෑම සියලු දේද සමග වේ. මෙය ඇඹිලිපිටිය දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ හිමිකම එල් 24/60 යටතේ ලියාපදිංචි වී තිබේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි.

කේ. ඒ. එල්. ටී. රණවීර,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී
(නීති)/මාණ්ඩලික ලේකම්.

08 - 128/5

---

### හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී - මොරටුමුල්ල ශාඛාව

**1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගන්නා ලද යෝජනා සම්මතයයි**

මෙරෙන්ඥ්ඥගේ පින්සිරි සල්ගාදු
මලිම්ගේ දුලානි ධම්මිකා ප්‍රනාන්දු *හෙවත්* මලිම්ගේ දුලානි ධම්මිකා සල්ගාදු
ඩී පී ඩී ලංකා ඔටෝ මෝට්ව් හි හවුල්කරුවන්

2022 ජූනි මස 30 වැනි දින පවත්වන ලද හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමකදී පහත දැක්වෙන පරිදි විශේෂයෙන් හා ඒකමතිකව යෝජනා සම්මත කරගන්නා ලදී.

හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී විසින් මෙරෙන්ඥ්ඥගේ පින්සිරි සල්ගාදු සහ මලිම්ගේ දුලානි ධම්මිකා ප්‍රනාන්දු *හෙවත්* මලිම්ගේ දුලානි ධම්මිකා සල්ගාදු වෙත ප්‍රදානය කරන ලද රු. 10,500,000.00ක වාරික ණය පහසුකම ආපසු ගෙවීම සඳහා සුරක්ෂිතයක් වශයෙන් හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි වාසියට, කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් පී. වී. එන්. ඩබ්. පෙරේරා විසින් ලියා සහතික කරන ලද අංක 5449 හා 2016.11.24 දින දරන උකස් බැඳුම්කරය මගින් ඩී පී ඩී ලංකා ඔටෝ මෝට්ව් යන නාමය, විලාසය හා ව්‍යවහාරික ව්‍යාපාර නාමය යටතේ හවුලේ ව්‍යාපාරික කටයුතු පවත්වාගෙන යන මෙරෙන්ඥ්ඥගේ පින්සිරි සල්ගාදු සහ මලිම්ගේ දුලානි ධම්මිකා ප්‍රනාන්දු *හෙවත්* මලිම්ගේ දුලානි ධම්මිකා සල්ගාදු යන අය ණයකරුවන් වශයෙන් මෙහි පළමුවන උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇති දේපළ උකස්කර බැඳතබා තිබේ.

හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී විසින් මෙරෙන්ඥ්ඥගේ පින්සිරි සල්ගාදු සහ මලිම්ගේ දුලානි ධම්මිකා ප්‍රනාන්දු *හෙවත්* මලිම්ගේ දුලානි ධම්මිකා සල්ගාදු වෙත ප්‍රදානය කරන ලද රු. 8,000,000.00ක වාරික ණය පහසුකම ආපසු ගෙවීම සඳහා සුරක්ෂිතයක් වශයෙන් හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි වාසියට, කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් පී. වී. එන්. ඩබ්. පෙරේරා විසින් ලියා සහතික කරන ලද අංක 5943 හා 2018.04.20 දින දරන උකස් බැඳුම්කරය මගින් ඩී පී ඩී ලංකා ඔටෝ මෝට්ව් යන නාමය, විලාසය හා ව්‍යවහාරික ව්‍යාපාර නාමය යටතේ හවුලේ ව්‍යාපාරික කටයුතු පවත්වාගෙන යන මෙරෙන්ඥ්ඥගේ පින්සිරි සල්ගාදු සහ මලිම්ගේ දුලානි ධම්මිකා ප්‍රනාන්දු *හෙවත්* මලිම්ගේ දුලානි ධම්මිකා සල්ගාදු යන අය ණයකරුවන් වශයෙන් මෙහි දෙවන උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇති දේපළ උකස්කර බැඳතබා තිබේ.

තව ද, ඩී පී ඩී ලංකා ඔටෝ මෝට්ව් යන නාමය, විලාසය හා ව්‍යාපාරික ව්‍යාපාර නාමය යටතේ හවුලේ ව්‍යාවහාරික කටයුතු පවත්වාගෙන යන එකී මෙරෙන්ඥ්ඥගේ පින්සිරි සල්ගාදු මලිම්ගේ දුලානි ධම්මිකා ප්‍රනාන්දු *හෙවත්* මලිම්ගේ

දුලානි ධම්මිකා සල්ගාදු යන අය විසින් එකී බැඳුම්කර මත සහ පිළිවෙලින් රු. 10,500,000.00ක සහ රු. 8,000,000.00ක එකී වාරික ණය මත හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙත අයවිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති අතර, ඒ අනුව දැන් එකී 2017.07.20 දින දරන උකස් කිරීමේ සාධනපත්‍රය මත 2022 අප්‍රේල් 28 වැනි දිනට රුපියල් මිලියන දහනමයයි දෙලක්ෂ දහහතර දහස් අටසිය විසි හයයි ශත පනහ (රු. 19,214,826.50)ක මුදලක් පමණක් හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙත ලැබිය යුතුව සහ අයවිය යුතුව ඇති අතර, ඒ අනුව, මුදල් ලැබෙනතුරු කරන ලද ගෙවීම් (ඇත්නම්) ඒවා අඩුකොට, විකුණුම් දිනය දක්වා පිළිවෙලින් රු. 10,500,000.00ක සහ රු. 8,000,000.00 ප්‍රාග්ධන හිඟය මත 2022 අප්‍රේල් 29 වැනි දින සිට වර්ෂයකට AWPLR+ 3% ක අනුපාතයට තවදුරටත් පොළිය ද සමග පිළිවෙලින් එකී රු. 10,905,285.68 ක සහ 8,309,540.82 ක මුදල සහ ප්‍රචාරණ පිරිවැය සහ දරන ලද අනෙකුත් ගාස්තු ද සමග අයකරගැනීම සඳහා එකී 2017.07.20 දින දරන උකස්කිරීමේ සාධනපත්‍රය මගින් හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙත උකස්කරන ලද සහ මෙහි උපලේඛනයේ විස්තර කර ඇති දේපළ, මුළු දිවයිනටම බලයලත් වෙන්දේසිකරු ඊ. එස්. රාමනායක මගින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල යටතේ හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙමගින් යෝජනා සම්මත කරගනී.

## පළමුවන උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, පල්ලේ පත්තුවේ, සල්පිටි කෝරළේ, මොරටුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය සහ මහනගර සභා සීමාව තුළ 559 - ඉදිබැද්ද බටහිර ග්‍රාම නිලධාරි වසම තුළ ඉහළ ඉදිබැද්දේ පිහිටි වරිපනම් අංක 2/7 සහ 2/8 - ඉහළ ඉදිබැද්ද පාර දරන "ගොරකගහලන්ද, ගොරකගහ කනත්ත සහ කටුගස්තුඩුවේවත්ත" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ජේ. ජී. ඩී. අර්සකුලරත්න විසින් සාදන ලද අංක 903 හා 2008 ඔක්තෝබර් 06 දින දරන පිඹුරේ ලොට් ඒ වශයෙන් ලකුණු කර ඇති බෙදා වෙන්කරන ලද ඉඩම් කොටසට මායිම් වශයෙන්, උතුරට : කුඩාපිටිය මාවත ද, නැගෙනහිරට : ග්‍රේටා ප්‍රනාන්දු සහ සුනිල් ශාන්තගේ දේපළ ද, දකුණට : රූපසිරි සමරසේකරගේ සහ සුනිල් ශාන්තගේ දේපළ, සහ බස්නාහිරට : චාලට් ප්‍රනාන්දුගේ සහ ග්‍රේෂන් ෆොන්සේකාගේ දේපළ ද මායිම් වූ පර්චස් විස්සයි දශම තුනයි බිංදුව (පර්. 20.30) විශාලත්වයෙන් යුත් ඉඩම සහ ඒ තුළ පිහිටි ගොඩනැගිලි ඇතුළු සෑම සියලු දේද වේ. මෙය දෙල්කඳ නුගේගොඩ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ හිමිකම එම් 3181/173ඒ යටතේ ලියාපදිංචි වී තිබේ.

බලයලත් මිනින්දෝරු ආර්. ඩබ්. ප්‍රනාන්දු විසින් සාදන ලද අංක 11 හා 1958 අගෝස්තු 27 දින දරන පිඹුරේ ලොට් 7 වශයෙන් ලකුණු කර ඇති මාර්ගය සඳහා වෙන්කිරීම මතින් වන මාර්ග අයිතිය ද සමග වේ.

## දෙවන උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, පල්ලේ පත්තුවේ, සල්පිටි කෝරළේ, මොරටුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය සහ මහනගර සභා සීමාව තුළ 559 - ඉදිබැද්ද බටහිර ග්‍රාම නිලධාරි වසම තුළ ඉදිබැද්දේ පිහිටි "ගොරකගහලන්ද, ගොරකගහ කනත්ත සහ කටුගස්තුඩුවේවත්ත" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ආර්. ඩබ්. ප්‍රනාන්දු විසින් සාදන ලද අංක 11 හා 1958 අගෝස්තු 27 දින දරන පිඹුරේ ලොට් 3 වශයෙන් ලකුණු කර ඇති බෙදා වෙන්කරන ලද ඉඩම් කොටසට මායිම් වශයෙන්, උතුරට : මෙම ඉඩමේම ලොට් 07 (පාර සඳහා වෙන්කිරීම) ද, නැගෙනහිරට : මෙම ඉඩමේම ලොට් 2 ද, දකුණට : ජෝන් අප්පුහාමිගේ දේපළ සහ බස්නාහිරට : මෙම ඉඩමේම ලොට් 4 ද මායිම් වූ පර්චස් විස්සක් (පර්. 20) විශාලත්වයෙන් යුත් ඉඩම සහ ඒ තුළ පිහිටි ගොඩනැගිලි ඇතුළු සෑම සියලු දේ ද වේ.

ඉහත කී දේපළ මෑතක දී කරන ලද මැනීමකට අනුව බලයලත් මිනින්දෝරු කේ. එල්. කුලවංස විසින් සාදන ලද අංක 93 හා 2002 දෙසැම්බර් 12 දින දරන පිඹුරේ පෙන්වා ඇති අතර, එය පහත සඳහන් පරිදි විස්තර කෙරේ.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, පල්ලේ පත්තුවේ, සල්පිටි කෝරළේ, මොරටුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය සහ මහනගර සභා සීමාව තුළ 559 - ඉදිබැද්ද බටහිර ග්‍රාම නිලධාරි වසම තුළ ඉදිබැද්දේ පිහිටි "ගොරකගහලන්ද, ගොරකගහ කනත්ත සහ කටුගස්තුඩුවේවත්ත" නමැති ඉඩමට එකී අංක 993 දරන පිඹුරේ ලොට් 3 වශයෙන් ලකුණු කර ඇති බෙදා වෙන්කරන ලද ඉඩම් කොටසට මායිම් වශයෙන්, උතුරට : දැන් එම්සී පාර යනුවෙන් දක්වනු ලබන ලොට් 7 (අඩි 15ක් පළල පාර) ද, නැගෙනහිරට : පිනිසිසි සල්ගාදුගේ ඉඩම ද, දකුණට : ආර්. රූපසිංහගේ ඉඩම සහ බස්නාහිරට : ශ්‍රියානන්ද පීරිස්ගේ ඉඩම ද මායිම් වූ පර්චස් විස්සක් (පර්. 20) විශාලත්වයෙන් යුත් ඉඩම සහ ඒ තුළ පිහිටි ගොඩනැගිලි ඇතුළු සෑම සියලු දේ ද වේ.

බලයලත් මිනින්දෝරු ආර්. ඩබ්. ප්‍රනාන්දු විසින් සාදන ලද අංක 11 හා 1958 අගෝස්තු 27 දින දරන පිඹුරේ ලොට් 7 වශයෙන් ලකුණු කර ඇති මාර්ගය සඳහා වෙන්කිරීම මතින් වන මාර්ග අයිතියද සමග වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි.

කේ. ඒ. එල්. ටී. රණවීර,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි
(නීති)/මාණ්ඩලික ලේකම්.

08 - 128/6

## හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී - මොරටුව ශාඛාව

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගන්නා ලද යෝජනා සම්මතයයි

දැදිගමුවගේ ප්‍රැන්සිස් නිමල් ඩයස්
සෙන්ට් මේරිස් සෝ මිල්ස් හි තනි අයිතිකරු

2022 ජුනි මස 30 වැනි දින පවත්වන ලද හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමකදී පහත දැක්වෙන පරිදි විශේෂයෙන් හා ඒකමතිකව යෝජනා සම්මත කරගන්නා ලදී.

හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී විසින් සෙන්ට් මේරිස් සෝ මිල්ස් යන නාමය, විලාසය හා ව්‍යාවහාරික ව්‍යාපාර නාමය යටතේ තනි පුද්ගල ව්‍යාපාරයේ යෙදී සිටින දැදිග මුවගේ ප්‍රැන්සිස් නිමල් ඩයස් වෙත ප්‍රදානය කරන ලද රු. 14,826,000.00ක වාරික ණය ආපසු ගෙවීම සඳහා සුරක්ෂිතයක් වශයෙන් හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි වාසියට, කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එන්. ජේ. ප්‍රනාන්දු විසින් සියල්ල ලියා සහතික කරන ලද අංක 2238 හා 1996.02.03 දින දරන, අංක 4945 හා 2001.08.30 දින දරන, අංක 6962 හා 2005.05.30 දින දරන, අංක 8260 හා 2008.02.21 දින දරන, අංක 9393 හා 2011.03.24 දින දරන, අංක 10559 හා 2014.09.10 දින දරන, අංක 10603 හා 2015.04.23 දින දරන, අංක 10759 හා 2016.02.16 දින දරන සහ අංක 10984 හා 2017.02.28 දින දරන උකස් බැඳුම්කර මගින් සෙන්ට් මේරිස් සෝ මිල්ස් යන නාමය, විලාසය සහ ව්‍යාවහාරික ව්‍යාපාර නාමය යටතේ තනි පුද්ගල ව්‍යාපාරයේ යෙදී සිටින දැදිගමුවගේ ප්‍රැන්සිස් නිමල් ඩයස් යන අය ණයකරු වශයෙන් මෙහි උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇති දේපළ උකස්කර බැඳතබා තිබේ.

තව ද, එකී සෙන්ට් මේරිස් සෝ මිල්ස් යන නාමය, විලාසය හා ව්‍යාවහාරික ව්‍යාපාර නාමය යටතේ තනි පුද්ගල ව්‍යාපාරයේ යෙදී සිටින දැදිගමුවගේ ප්‍රැන්සිස් නිමල් ඩයස් යන අය විසින් එකී බැඳුම්කර සහ රු. 14,826,000.00ක වාරික ණය මත හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙත අයවිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති අතර, ඒ අනුව දැන් එකී බැඳුම්කර මත 2022 අප්‍රේල් 25 වනි දිනට රුපියල් මිලියන පහළොවයි දෙලක්ෂ හැත්තෑ නම දහස් හාරසිය හැට දෙකයි ශත දෙක (රු. 15,279,462.02) ක මුදලක් පමණක් හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙත ලැබිය යුතුව සහ අයවිය යුතුව ඇති අතර, ඒ අනුව, මුදල් ලැබෙනතුරු කරන ලද ගෙවීම් (ඇත්නම්) ඒවා අඩුකොට, විකුණුම් දිනය දක්වා රු. 14,774,260.00ක ප්‍රාග්ධන හිඟය මත 2022 අප්‍රේල් 26 වැනි දින සිට වර්ෂයකට 12%ක අනුපාතයට තවදුරටත් පොළියද සමග එකී රු. 15,279,462.02ක මුදල සහ ප්‍රචාරණ පිරිවැය සහ දරන ලද අනෙකුත් ගාස්තු ද සමග අයකරගැනීම සඳහා එකී අංක 2238, 4945, 6962, 8260, 9393, 10559, 10603, 10759 සහ 10984 දරන බැඳුම්කර මගින් හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙත උකස්කරන ලද සහ මෙහි උපලේඛනයේ සවිස්තර කර ඇති දේපළ, මුළු දිවයිනටම බලයලත් වෙන්දේසිකරු ජේ. ඩබ්. ඊ. ජයවර්ධන මගින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල යටතේ හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙමගින් යෝජනා සම්මත කරගනී.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ, (මොරටුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය සහ 554සී - කොරලවැල්ල බටහිර ග්‍රාම නිලධාරි වසම තුළ) මොරටුව මහනගර සභා සීමාව තුළ සමාජවාදී නිවහන් පෙදෙස, කොරලවැල්ලේ පිහිටි "මාදන්ගහවත්ත" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ඩබ්. ජේ. එම්. පී. එල්. ද සිල්වා විසින් සාදන ලද අංක 11/95 හා 1995 පෙබරවාරි 08 දින දරන පිඹුරේ ලොට් 1 වශයෙන් ලකුණු කර ඇති බෙදා වෙන්කරන ලද ඉඩම් කොටසට මායිම් වශයෙන්, උතුරට : සමාජවාදී නිවහන් පෙදෙස සහ ලොට් 5 ද, නැගෙනහිරට : ලොට් 6 සහ 5 ද, දකුණට : එච්. එන්. ජේ. ප්‍රනාන්දුගේ සහ ෂෙල්ටන් පීරිස්ගේ දේපළ සහ බස්නාහිරට : ඩී. ආර්. එල්. මෙන්ඩිස්, කේ. ඩබ්. විනිෆ්‍රීඩා ප්‍රනාන්දු සහ කාන්ති අසෝකා විජේසේකරගේ දේපළ ද මායිම් වූ පර්චස් දහසයයි දශම නමයයි හයක (පර්. 16.96) විශාලත්වයෙන් යුත් ඉඩම සහ ඒ තුළ පිහිටි සෑම සියලු දේද සමග වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි.

කේ. ඒ. එල්. ටී. රණවීර,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී
(නීති)/මාණ්ඩලික ලේකම්.

08 - 128/7

---

## හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී - මොරටුව ශාඛාව

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගන්නා ලද යෝජනා සම්මතයයි

කරුණාකලගේ ජොහැන් ද සිල්වා

2022 ජුනි මස 30 වැනි දින පවත්වන ලද හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමකදී පහත දැක්වෙන

පරිදි විශේෂයෙන් හා ඒකමතිකව යෝජනා සම්මත කරගන්නා ලදී.

හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී විසින් කරුණාකලගේ ජොහැන් ද සිල්වා වෙත ප්‍රදානය කරන ලද රු. 11,300,000.00ක වාරික ණයක් ආපසු ගෙවීම සඳහා සුරක්ෂිතයක් වශයෙන් හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි වාසියට, කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් පී. වී. එන්. ඩබ්. පෙරේරා විසින් ලියා සහතික කරන ලද අංක ටීආර් 147 හා 2016.03.02 දින දරන සහ අංක ටීආර් 210 හා 2017.02.22 දින දරන උකස් බැඳුම්කර මගින් කරුණාකලගේ ජොහැන් ද සිල්වා ණයකරු වශයෙන් මෙහි උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇති දේපළ උකස්කර බැඳතබා තිබේ.

තව ද, එකී කරුණාකලගේ ජොහැන් ද සිල්වා යන අය විසින් එකී බැඳුම්කර මත සහ රු. 11,300,000.00ක එකී වාරික ණය මත හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙත අයවිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති අතර, ඒ අනුව දැන් එකී බැඳුම්කර මත 2022 අප්‍රේල් 29 වැනි දිනට රුපියල් මිලියන හයයි පන් ලක්ෂ අනූ හතර දහස් දෙසිය විසි හත (රු. 6,594,227.00) ක මුදලක් පමණක් හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙත ලැබිය යුතුව සහ අයවිය යුතුව ඇති අතර, ඒ අනුව, මුදල් ලැබෙනතුරු කරන ලද ගෙවීම් (ඇත්නම්) ඒවා අඩුකොට, විකුණුම් දිනය දක්වා රු. 6,356,600.00 ප්‍රාග්ධන හිඟය මත 2022 අප්‍රේල් 30 වැනි දින සිට වර්ෂයකට AWPLR+4%ක අනුපාතයට තවදුරටත් පොළියද සමග එකී රු. 6,594,227.00 ක මුදල සහ ප්‍රචාරණ පිරිවැය සහ දරන ලද අනෙකුත් ගාස්තු ද සමග අයකරගැනීම සඳහා එකී අංක ටීආර් 147 හා ටීආර් 210 දරන බැඳුම්කර මගින් හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙත උකස්කරන ලද සහ මෙහි උපලේඛනයේ විස්තර කර ඇති දේපළ, මුළු දිවයිනටම බලයලත් වෙන්දේසිකරු ඊ. රාමනායක මගින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල යටතේ හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙමගින් යෝජනා සම්මත කරගනී.

## උපලේඛනය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, මොරටුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස සීමාව තුළ 553ඒ - මොරටුවැල්ල උතුර ග්‍රාම නිලධාරි වසම තුළ රාවතාවත්තේ පිහිටි කැඩැස්තර සිතියම් අංක 520214 හි අංක 04 දරන කට්ටියේ අංක 95 වශයෙන් ලකුණු කර ඇති බෙදා වෙන්කරන ලද ඉඩම් කොටසට මායිම් වශයෙන්, උතුරට : අංක 94 දරන ඉඩම් කොටස (පාර සඳහා වෙන් කිරීම), නැගෙනහිරට : අංක 60 දරන ඉඩම් කොටස ද, දකුණට : අංක 98 දරන ඉඩම් කොටස, බස්නාහිරට : අංක 96 දරන ඉඩම් කොටස ද මායිම් වූ හෙක්ටයාර් බිංදුවයි දශම බිංදුවයි දෙකයි එකයි දෙක (හෙක්. 0.0212) විශාලත්වයෙන් යුත් 1998 අංක 21 දරන හිමිකම් ලියාපදිංචි කිරීමේ පනත යටතේ ලියාපදිංචි වී ඇති ඉඩම වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි.

කේ. ඒ. එල්. ටී. රණවීර,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී
(නීති)/මාණ්ඩලික ලේකම්.

08 - 128/8

## හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී - ග්‍රීන්පාත් ශාඛාව

**1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගන්නා ලද යෝජනා සම්මතයයි**

විජිත රංජිත් විජේසේකර

2022 ජුනි මස 30 වැනි දින පවත්වන ලද හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමක දී පහත දැක්වෙන පරිදි විශේෂයෙන් හා ඒකමතිකව යෝජනා සම්මත කරගන්නා ලදී.

හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී විසින් විජිත රංජිත් විජේසේකර වෙත ප්‍රදානය කරන ලද රු. 9,100,464.89ක වාරික ණය පහසුකමක් ආපසු ගෙවීම සඳහා සුරක්ෂිතයක් වශයෙන් හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි වාසියට, කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් යූ. එස්. කේ. හේරත් විසින් ලියා සහතික කරන ලද අංක 6827 හා 2020.08.13 දින දරන උකස් බැඳුම්කරය මගින් විජිත රංජිත් විජේසේකර ණයකරු වශයෙන් මෙහි උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇති දේපළ උකස්කර බැඳතබා තිබේ.

තව ද, එකී විජිත රංජිත් විජේසේකර යන අය විසින් එකී බැඳුම්කරය මත සහ රු. 9,100,464.89ක එකී වාරික ණය පහසුකම මත හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙත අයවිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති අතර, ඒ අනුව දැන් එකී බැඳුම්කරය මත 2022 අප්‍රේල් 06 වැනි දිනට රුපියල් මිලියන දහයයි පන් ලක්ෂ හත්සිය පනහයි ශත දොළහ (රු. 10,500,750.12)ක මුදලක් පමණක් හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙත ලැබිය යුතුව සහ අයවිය යුතුව ඇති අතර, ඒ අනුව එතෙක් කරන ලද ගෙවීම් (ඇත්නම්) ඒවා අඩුකොට, විකුණුම් දිනය දක්වා රු. 8,795,955.65ක ප්‍රාග්ධන හිඟය මත 2022 අප්‍රේල් 07 වැනි දින සිට වර්ෂයකට 15%ක අනුපාතයට තවදුරටත් පොළිය ද සමග එකී රු. 10,500,750.12ක මුදල සහ ප්‍රචාරණ පිරිවැය සහ දරන ලද අනෙකුත් ගාස්තු ද සමග අයකරගැනීම සඳහා එකී අංක 6827 දරන බැඳුම්කරය මගින් හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙත උකස්කරන ලද සහ මෙහි උපලේඛනවල විස්තර කර ඇති දේපළ, මුළු දිවයිනටම බලයලත් වෙන්දේසිකරු ජේ. ඩබ්. ඊ. ජයවර්ධන මගින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල යටතේ හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙමගින් යෝජනා සම්මත කරගනී.

## උපලේඛනය

දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, වැලිගම් කෝරලේ, වැලිගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය සහ වැලිගම ප්‍රාදේශීය

සභා සීමාව තුළ 404 - කොටවිල දකුණ ග්‍රාම නිලධාරි වසම තුළ කඹුරුගමුව ගමේ පිහිටි "පරගහහේන", "පින්නයාගොඩැල්ල" සහ "කොලොට්ටෙදෙනිය" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු කේ. ජී. එස්. යාපා විසින් සාදන ලද අංක 2228 හා 1994 ඔක්තෝබර් 16 දින දරන පිඹුරේ ලොට් 4 වශයෙන් ලකුණු කර ඇති බෙදා වෙන්කරන ලද ඉඩම් කොටසට මායිම් වශයෙන්, උතුරු - නැගෙනහිරට ː මාතර දිසා අධිකරණ නඩු අංක ඩීසී 3857 හි ලොට් 4 සහ 5 ද, දකුණු - නැගෙනහිරට ː අංක 2228 දරන පිඹුරේ ලොට් 5 ද, දකුණු - බස්නාහිරට ː අංක 228 දරන පිඹුරේ ලොට් 7 (අඩි 12ක පළල පාර සඳහා වෙන්කිරීම) සහ උතුරු - බස්නාහිරට ː කොටවිල වත්ත ද මායිම් වූ අක්කර එකයි රූඩ් තුනයි පර්චස් තිස් එකක් (අ.1, රූ.3, පර්.31) විශාලත්වයෙන් යුත් ඉඩම වේ. මෙය මාතර දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ හිමිකම පී 49/132 යටතේ ලියාපදිංචි වී තිබේ.

ඉහත කී දේපළ, මෑතකදී කරන ලද මැනීමකට අනුව පහත සඳහන් පරිදි විස්තර කෙරේ.

දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, වැලිගම් කෝරලේ, වැලිගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය සහ වැලිගම ප්‍රාදේශීය සභා සීමාව තුළ 404 - කොටවිල දකුණ ග්‍රාම නිලධාරි වසම තුළ කඹුරුගමුව ගමේ පිහිටි "පරගහහේන", "පින්නයාගොඩැල්ල" සහ "කොලොට්ටෙදෙනිය" නමැති ලොට් 4 දරන ඉඩමට බලයලත් මිනින්දෝරු කේ. ජී. එස්. යාපා විසින් සාදන ලද අංක 6600 හා 2016 අගෝස්තු 20 දින දරන පිඹුරේ ලොට් 4 වශයෙන් ලකුණු කර ඇති බෙදා වෙන්කරන ලද ඉඩම් කොටසට මායිම් වශයෙන්, උතුරු - නැගෙනහිරට ː මාතර දිසා අධිකරණ නඩු අංක ඩීසී 3857 හි ලොට් 4 සහ 5 ද, දකුණු - නැගෙනහිරට ː මෙම ඉඩමේම ලොට් 5 ද, දකුණු - බස්නාහිරට ː මෙම ඉඩමේම ලොට් 7 (අඩි 12ක් පළල පාර සඳහා වෙන්කිරීම) සහ උතුරු - බස්නාහිරට ː කොටවිල වත්තද මායිම් වූ අක්කර එකයි රූඩ් තුනයි පර්චස් තිස් එකක් (අ.1, රූ.3, පර්.31) විශාලත්වයෙන් යුත් ඉඩම වේ.

බලයලත් මිනින්දෝරු කේ. ජී. එස්. යාපා විසින් සාදන ලද අංක 2228 හා 1994 ඔක්තෝබර් 16 දින දරන පිඹුරේ ලොට් 7 වශයෙන් ලකුණු කර ඇති (අඩි 12ක් පළල පාර සඳහා වෙන් කිරීම) මතින් හා ඒ දිගේ වන මාර්ග අයිතියද සමග වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි.

කේ. ඒ. එල්. ටී. රණවීර,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි
(නීති)/මාණ්ඩලික ලේකම්.

08 - 128/9

## හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී - සීදූව ශාඛාව

### 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගන්නා ලද යෝජනා සම්මතයයි

සංජීව වික්‍රමරත්න
විජේසුන්දර පතිරන්නැහැලාගේ ක්‍රිෂාන්ති ශිරෝමාලා විජේසුන්දර
විසිතුරු ෆැමිලි සුපර් හි හවුල්කරුවන්

2022 ජුනි මස 30 වැනි දින පවත්වන ලද හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමකදී පහත දැක්වෙන පරිදි විශේෂයෙන් හා ඒකමතිකව යෝජනා සම්මත කරගන්නා ලදී.

හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී විසින් සංජීව වික්‍රමරත්න සහ විජේසුන්දර පතිරන්නැහැලාගේ ක්‍රිෂාන්ති ශිරෝමාලා විජේසුන්දර වෙත ප්‍රදානය කරන ලද රු. 36,000,000.00ක සංවර්ධන ණය ආපසු ගෙවීම සඳහා සුරක්ෂිතයක් වශයෙන් හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි වාසියට, ගම්පහ ප්‍රසිද්ධ නොතාරිස් පී. එන්. ඒකනායක විසින් ලියා සහතික කරන ලද 2017.07.20 දින දරන උකස් කිරීමේ සාධනපත්‍රය මගින් විසිතුරු ෆැමිලි සුපර් යන නාමය, විලාසය හා ව්‍යවහාරික ව්‍යාපාර නාමය යටතේ හවුලේ ව්‍යාපාරික කටයුතුවල යෙදී සිටින සංජීව වික්‍රමරත්න සහ විජේසුන්දර පතිරන්නැහැලාගේ ක්‍රිෂාන්ති ශිරෝමාලා විජේසුන්දර ණයකරුවන් වශයෙන් මෙහි උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇති දේපළ උකස්කර බැඳතබා තිබේ.

තවද, එකී සංජීව වික්‍රමරත්න සහ විජේසුන්දර පතිරන්නැහැලාගේ ක්‍රිෂාන්ති ශිරෝමාලා විජේසුන්දර යන අය විසින් එකී 2017.07.20 දින දරන උකස්කිරීමේ සාධනපත්‍රය මත සහ රු. 36,000,000.00ක එකී සංවර්ධන ණය පහසුකම මත හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙත අයවිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති අතර, ඒ අනුව දැන් එකී 2017.07.20 දින දරන උකස්කිරීමේ සාධනපත්‍රය මත 2022 අප්‍රේල් 20 වැනි දිනට රුපියල් මිලියන විසි අටයි අට ලක්ෂ විසි හය දහස් අටසිය තිස් හතයි ශත දොළහ (රු. 28,826,837.12)ක මුදලක් පමණක් හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙත ලැබිය යුතුව සහ අයවිය යුතුව ඇති අතර, ඒ අනුව, එතෙක් කරන ලද ගෙවීම් (ඇත්නම්) ඒවා අඩුකොට, විකුණුම් දිනය දක්වා රු. 27,462,635.45ක ප්‍රාග්ධන හිඟය මත 2022 අප්‍රේල් 21 වැනි දින සිට වර්ෂයකට 15%ක අනුපාතයට තවදුරටත් පොළියද සමග එකී රු. 28,826,837.12ක මුදල සහ ප්‍රචාරණ පිරිවැය සහ දරන ලද අනෙකුත් ගාස්තු ද සමග අයකරගැනීම සඳහා එකී 2017.07.20 දින දරන උකස්කිරීමේ සාධනපත්‍රය මගින් හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී වෙත උකස්කරන ලද මෙහි උපලේඛනයේ විස්තර කර ඇති දේපළ, මුළු දිවයිනටම බලයලත් වෙන්දේසිකරු

අයි. ඩබ්. ජයසූරිය මගින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල යටතේ හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙමගින් යෝජනා සම්මත කරගනී.

## උපලේඛනය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ, බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, අත්තනගල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ අංක 332- වටද්දර සහ අංක 332බී, වටද්දර, වටද්දර බටහිර ග්‍රාම නිලධාරි වසම තුළ වටද්දර පිහිටි කැඩැස්තර සිතියම් අංක 510617 හි දක්වා ඇති අංක 0191 දරන ප්‍රමාණයෙන් හෙක්ටයාර් බිංදුවයි දශම බිංදුවයි තුනයි හයයි අටක් (හෙක්. 0.0368) විශාලත්වයෙන් යුත් බෙදා වෙන්කරන ලද බිම් කොටස. මෙය 1998 අංක 21 දරන හිමිකම් ලියාපදිංචි කිරීමේ පනත යටතේ ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි වී තිබේ.

අංක 510617 දරන කැඩැස්තර සිතියම මතින් වන මාර්ග අයිතියද සමග වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි.

කේ. ඒ. එල්. ටී. රණවීර,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි
(නීති)/මාණ්ඩලික ලේකම්.

08 - 128/10

---

## කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. - තලවකැලේ ශාඛාව

### 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හි (ලියාපදිංචි අංකය පී. කිව්. 116) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නිශ්චය කරනු ලැබූ අභියෝජනාව

ණය ගිණුම් අංකය : 2746000
මෙහේෂ් චන්දන හේවාපතිරණ සහ හෙන්ද විතාරණ ඉනෝකා නිමාලි
යේල්යා කොටස්කරුවන්

2022 පෙබරවාරි 25 වැනි දින පවත්වන ලද රැස්වීමකදී කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය විශේෂයෙන් හා ඒකච්ඡන්දයෙන් මෙසේ නිශ්චය කරන ලදී.

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එම්. අයි. අල්විස් විසින් 2016 ජූනි 27 වැනි දින සහතික කරන ලද අංක 206 සහ කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එම්. එස්. පී. පීරිස් විසින් 2018 ජූලි 09 වැනි දින සහතික කරන ලද අංක 832 දරන කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. නමට ලියන ලද්දාවූ ද (මෙහි පහත 1 වන උපලේඛනයේ සවිස්තරව විස්තර කරන ලද ඉඩම) බැඳුම්කරයන් යටතේ අයවිය යුතු මුදල් ගෙවීම නිට්ටඹුව, නුවර පාරේ, ශ්‍රී රම්‍ය ගොඩනැගිල්ලේ, යේල්යා යන නාමය සහ විලාසය යටතේ හවුල් ව්‍යාපාරයක් ලෙස ව්‍යාපාරයක් පවත්වාගෙන යන මෙහේෂ් චන්දන හේවාපතිරණ සහ හෙන්ද විතාරණ ඉනෝකා නිමාලි ණයකරුවන් හැටියට පැහැර හැර ඇති හෙයින්,

සහ කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එම්. අයි. අල්විස් විසින් 2016 ජූනි 27 වැනි දින සහතික කරන ලද අංක 205 සහ කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එස්. ඩී. පෙරේරා විසින් 2017 ඔක්තෝබර් 13 වැනි දින සහතික කරන ලද අංක 147 දරන කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. නමට ලියන ලද්දාවූ ද (මෙහි පහත 2 වන උපලේඛනයේ සවිස්තරව විස්තර කරන ලද ඉඩම) බැඳුම්කරයන් යටතේ අයවිය යුතු මුදල් ගෙවීම යේල්යා යන නාමය සහ විලාසය යටතේ හවුල් ව්‍යාපාරයක් ලෙස ව්‍යාපාරයක් පවත්වාගෙ යන මහේෂ් චන්දන හේවාපතිරණ සහ හෙන්ද විතාරණ ඉනෝකා නිමාලි ණයකරුවන් හැටියට පැහැර හැර ඇති හෙයින්,

සහ නුවර ප්‍රසිද්ධ නොතාරිස් කේ. වී. ඒ. ඩී. සී. කේ. විපුලසේන විසින් 2015 දෙසැම්බර් 04 වැනි දින සහතික කරන ලද 1998, අංක 21 දරන හිමිකම් ලියාපදිංචි කිරීමේ පනත යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. නමට ලියන ලද්දාවූ ද (මෙහි පහත 3 වන උපලේඛනයේ සවිස්තරව විස්තර කරන ලද ඉඩම) උකස් සාධන පත්‍රය මත අයවිය යුතු මුදල් ගෙවීම යේල්යා යන නාමය සහ විලාසය යටතේ හවුල් ව්‍යාපාරයක් ලෙස ව්‍යාපාරයක් පවත්වාගෙන යන මහේෂ් චන්දන හේවාපතිරණ සහ හෙන්ද විතාරණ ඉනෝකා නිමාලි ණයකරුවන් හැටියට පැහැර හැර ඇති හෙයින්,

සහ කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එච්. එම්. සී. පී. හේරත් විසින් 2017 ඔක්තෝබර් 13 වැනි දින සහතික කරන ලද අංක 3378 දරන කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. නමට ලියන ලද්දාවූ ද (මෙහි පහත 4 වන උපලේඛනයේ සවිස්තරව විස්තර කරන ලද ඉඩම) බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම යේල්යා යන නාමය හා විලාසය යටතේ හවුල් ව්‍යාපාරයක් ලෙස ව්‍යාපාරයක් පවත්වාගෙන යන මහේෂ් චන්දන හේවාපතිරණ සහ හෙන්ද විතාරණ ඉනෝකා නිමාලි ණයකරුවන් හැටියට පැහැර හැර ඇති හෙයින්,

සහ එකී බැඳුම්කරයන් යටතේ රුපියල් මිලියන තුන්සිය දහඅටයි පන්ලක්ෂ අටදහස් පන්සිය හැත්තෑ හතරයි ශත අනූව (රු. 318,508,574.90)ක මුදලක් 2021 දෙසැම්බර් මස 30 වැනි දින වන විට කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හට දැන් අයවිය යුතුව හා ලැබිය යුතුව ඇති හෙයින් එකී රුපියල්

මිලියන තුන්සිය දහඅටයි පන්ලක්ෂ අටදහස් පන්සිය හැත්තෑ හතරයි ශත අනූව (රු. 318,508,574.90)ක මුදල අය කර ගැනීම සඳහා සහ 2021 දෙසැම්බර් 31 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට රු. 303,569,946.00ක මුදලක් මත වර්ෂයකට 8%ක බැගින් වැඩිදුර පොලිය ද සහිතව ප්‍රචාරක කටයුතු සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු ඇතුළුව මෙතෙක් ලබාගෙන ඇත්තාවූ යම් මුදලක් වේ නම් ඒවා ද අඩු කොට එකී අංක 206, 832, 205, 147, 2015.12.04 වැනි දින උකස් සාධන පත්‍රය සහ 3378 දරන බැඳුම්කරයන් මගින් කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හට උකස්කොට ඇත්තාවූ ද මෙහි පහත 1 වන, 2 වන, 3 වන සහ 4 වන උපලේඛනවල සවිස්තරව විස්තර කොට ඇත්තාවූද දේපළ හා පරිශ්‍රය කොළඹ 12, හල්ෆ්ට්ස්ඩෝප් වීදියේ, 2 වන මහලේ, අංක 200 දරන ස්ථානයේ බලයලත් වෙන්දේසිකරු එල්. බී. සේනානායක මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අය කර ගැනීමේ (විශේෂ විධි විධාන) පනතින් පවරා ඇති බලතල යටතේ කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලය නිශ්චය කරනු ලබයි.

## 1 වන උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ, මහරගම ප්‍රාදේශීය සභා සීමා ඇතුළත, මහරගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, තලවතුගොඩ බටහිර 479A, ග්‍රාම නිලධාරී සීමා ඇතුළත, තලවතුගොඩ, වැලිපාර, වරිපනම් අංක 68 සහ $68^{A}$ දරන ස්ථානයේ පිහිටි "අඹගහවත්ත සහ බටදොඹගහවත්ත" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු, එච්. කේ. මහින්ද විසින් 2016.05.24 වැනි දින පිළියෙල කරන ලද අංක 6658 දරන පිඹුරෙන් බෙදා වෙන් කරන ලද ලොට් Y වශයෙන් දැක්වෙන ඉඩම් කොටසට මායිම් වශයෙන්, උතුරට : අංක $5158/^{A}$ දරන පිඹුරේ ලොට් $A^{1}$ මගින් ද, නැගෙනහිරට : අංක 6241 දරන පිඹුරේ ලොට් X මගින් ද, දකුණට : වැලිපාර මගින් ද සහ බස්නාහිරට : වැලිපාර මගින් ද මායිම් වූ එකී අංක 6658 දරන පිඹුර ප්‍රකාරව පර්චස් විස්සයි දශම අටයි පහ (පර්. 20.85)ක විශාලත්වයෙන් වූ ඉඩම සමඟ ගොඩනැගිලි, ගහකොළ, වගාවන් සහ එහි පිහිටි සියළු දේත් සමග වන මෙය හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ C 127/140 යටතේ ලියාපදිංචි කර ඇත.

## 2 වන උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළේ, උඩුගහ පත්තුවේ, අත්තනගල්ල ප්‍රාදේශීය සභා සීමා ඇතුළත, අත්තනගල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මල්වත්ත 348E, ග්‍රාම නිලධාරී සීමා ඇතුළත, නම්බාදළුව ගමේ පිහිටි "හොරගොල්වත්ත" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු, ඩබ්. ඒ. නිහාල් විසින් 2014.11.10 වැනි දින පිළියෙල කරන ලද අංක 3533 දරන පිඹුරෙන් බෙදා වෙන් කර ලද ලොට් 21A වශයෙන් දැක්වෙන ඉඩම් කොටසට මායිම් වශයෙන්, උතුරට : අංක Co. 3963 දරන පිඹුරේ ලොට් 23 සහ පාර වෙන්කිරීම මගින් ද, නැගෙනහිරට : අංක Co. 3963 දරන පිඹුරේ ලොට් 19, ලොට් 21B සහ ඇල මගින් ද, දකුණට : ඇල මගින් ද සහ බස්නාහිරට : ඇල සහ අංක Co. 3963 දරන පිඹුරේ ලොට් 23 මගින් ද මායිම් වූ එකී අංක 3533 දරන පිඹුර ප්‍රකාරව අක්කර දෙකයි පර්චස් අටයි දශම නවය (අ.2, පර්. 8.9)ක විශාලත්වයෙන් වූ ඉඩම සමඟ පස, ගහකොළ, වගාවන් සහ එහි පිහිටි සියළු දේත් සමඟ වන මෙය අත්තනගල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙළුම/ පත්‍රිරුව B 336/100 යටතේ ලියාපදිංචි කර ඇත.

## 3 වන උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, 28 - මල්ලැහැව ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ සහ මීරිගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ඇතුළත, මල්ලැහැව ගමේ පිහිටි සර්වේයර් ජෙනරාල් විසින් පිළියෙල කරන ලද කැඩැස්තර සිතියම් අංක 510262 හි දැක්වෙන අංක 12 දරන ඉඩම් කොටස ප්‍රමාණයෙන් හෙක්ටයාර් බිංදුවයි දශම දෙකයි අටයි එකයි අටයි (හෙක්ටයාර් 0.2818)ක විශාලත්වයෙන් වූ ඉඩම සමඟ ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සියළු දේත් සමග වන මෙය මීගමුව හිමිකම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ හිමිකම් ලියාපදිංචි කිරීමේ සහතික අංක 00052533693 යටතේ ලියපදිංචි කර ඇත.

## 4 වන උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ, මහරගම නාගරික සභා සීමා ඇතුළත, මහරගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, දෙපානම 529A, ග්‍රාම නිලධාරී කොට්ඨාසය ඇතුළත, දෙපානම ගම, බොරැල්ල පාර, වරිපනම් අංක 208/4B දරන ස්ථානයේ පිහිටි "දෙල්ගහවත්ත" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු, එච්. ඒ. ඩී. ප්‍රේමරත්න විසින් 1999.09.30 වැනි දින පිළියෙල කරන ලද අංක 2692 දරන පිඹුරෙන් බෙදා වෙන් කරන ලද ලොට් $4E^{7}$ වශයෙන් දැක්වෙන ඉඩම් කොටසට මායිම් වශයෙන්, ඊසානට : බොරැල්ල පාරේ, වරිපනම් අංක 216 මගින් ද, ගිණිකොණට : අඩි 15 පළල පාර මගින් ද (අංක 958 දරන පිඹුරේ ලොට් 4C), නිරිතට : අංක 392 දරන පිඹුරේ ලොට් $4E^{1}$ සහ බොරැල්ල පාරේ, වරිපනම් අංක 212 සහ 214 මගින් ද සහ වයඹට : ලොට් $4E^{6}$ මගින් ද මායිම් වූ ඉහත කී අංක 2692 දරන පිඹුර ප්‍රකාරව පර්චස් දාහතයි දශම පහයි බිංදුව (පර්. 17.50)ක විශාලත්වයෙන් වූ ඉඩම සමග ගොඩනැගිල්ල සහ එහි පිහිටි සියළු දේත් සමග වන මෙය දෙල්කඳ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙළුම/පත්‍රිරුව B 429/98 යටතේ ලියාපදිංචි කර ඇත.

අංක 958 දරන පිඹුරේ ලොට් 4C ලකුණු කරන ලද අඩි 15 පළල පාර වෙන්කිරීම මතින් සහ දිගේ පොදු මාර්ග අයිතිය සමග වේ.

2022 අප්‍රේල් මස 05 වැනි දින,

ආර්. ඒ. පී. රාජපක්ෂ,
සමාගම් ලේකම්.

08 - 140

## මහජන බැංකුව - ඇඹිලිපිටිය ශාඛාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඩී වගන්තිය යටතේ යෝජනාව

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඩී (29D) වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2022.06.30 දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරන ලද බැව් මෙයින් නිවේදනය කරනු ලැබේ.

ප්‍රසිද්ධ නොතාරිස් සකුලා ප්‍රජාපතී කුමාරනායක මහත්මිය විසින් ලියා සහතික කරන ලද 2016.12.01 දිනැති අංක 03 දරන උකස්කරය, ප්‍රසිද්ධ නොතාරිස් දර්ශනී දසනායක මහත්මිය විසින් ලියා සහතික කරන ලද 2018.05.09 දිනැති අංක 3117 දරන උකස්කරය, 2018.10.16 දිනැති අංක 3209 දරන උකස්කරය ප්‍රකාර ගෙවීම් කිරීම.

දර්ශක උදයකුමාර හේමන්ත හඳුවල

යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද, එකී උකස්කරය යටතේ දැනට පිළිවෙලින් රුපියල් දෙකෝටි හතලිස් නමලක්ෂ දසදහසක (රු. 2,49,10,000.00) මුදලක්, රුපියල් හැට නමලක්ෂ අසූ දහසක (රු. 69,80,000.00) මුදලක්, රුපියල් හතලිස් නමලක්ෂ අනූ දහසක (රු. 49,90,000.00) මුදලක් මහජන බැංකුවට අයවීමට ඇති බැවින්ද, එකී මුදල් මත 2020.05.05 දින සිට රුපියල් දෙකෝටි හතලිස් නමලක්ෂ දසදහසක (රු. 2,49,10,000.00) මුදලකට වාර්ෂිකව සතිපතා බරිත සාමාන්‍ය ප්‍රමුඛ ණය දීමේ අනුපාතය + සියයට හතරයි දශම පහ (Weekly AWPLR + 4.5%), 2020.05.05 දින සිට රුපියල් හැට නමලක්ෂ අසූ දහසක (රු. 69,80,000.00) මුදලකට වාර්ෂිකව සතිපතා බරිත සාමාන්‍ය ප්‍රමුඛ ණය දීමේ අනුපාතය + සියයට හයයි දශම පහ (Weekly AWPLR + 6.5%), 2020.05.05 දින සිට රුපියල් හතලිස් නමලක්ෂ අනූ දහසක (රු. 49,90,000.00) මුදලකට වාර්ෂිකව සතිපතා බරිත සාමාන්‍ය ප්‍රමුඛ ණය දීමේ අනුපාතය + සියයට හතයි දශම පහ (Weekly AWPLR + 7.5%), බැගින් වෙන්දේසි දිනය තෙක් තවදුරටත් පොළිය හා අදාළ මහජන බැංකු පනතේ "29 එල්" (29 L) වගන්තිය යටතේ අයකර ගනු ලැබිය යුතු මුදල් සහ ගාස්තු ද සමග අනතුරුව කිසියම් ගෙවීමක් ලැබී ඇත්නම් ඒවා අඩුව එකී රුපියල් දෙකෝටි හතලිස් නමලක්ෂ දසදහසක (රු. 2,49,10,000.00) මුදල සහ පොළිය, රුපියල් හැට නමලක්ෂ අසූ දහසක (රු. 69,80,000.00) මුදල සහ පොළිය, රුපියල් හතලිස් නමලක්ෂ අනූ දහසක (රු. 49,90,000.00) මුදල සහ පොළිය අයකර ගැනීම සඳහා කොළඹ බලයලත් වෙන්දේසිකාර ෂොක්මන් සහ සමරවික්‍රම සමාගම විසින් එකී අංක 03, 3117 සහ 3209 දරන උකස්කර යටතේ එකී බැංකුවට උකස්කර ඇති නිශ්චල දේපළ හා පරිශ්‍රයන් ප්‍රසිද්ධ වෙන්දේසියකදී විකිණිය යුතු යැයි 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනත යටතේ තමන් වෙත පැවරී ඇති බලතල අනුව මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් තීරණය කරයි.

### උකස්කර ඇති දේපළ පිළිබඳ විස්තර

සබරගමු පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, කොළොන්න කෝරළේ, දියපොතගම් පත්තුවේ, ඇඹිලිපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ඇඹිලිපිටිය නගර සභා සීමාව තුළ, පල්ලෙගම ග්‍රාම නිලධාරි වසමේ, ඇඹිලිපිටිය පල්ලෙගම ගමේ පිහිටි "බිම්බදූයාය" නැමති ඉඩමට අවසරලත් මානක එල්. කේ. ගුණසේකර මහතා විසින් මැන සම්පාදිත අංක 6562 සහ 2015.03.28 දිනැති පිඹුරේ කැබලි අංක A ලෙස සඳහන්,

උතුරට : ටී. ඩී. ප්‍රේමදාස සහ කේ. දයාවතී හිමිකම් කියන ඉඩම ද, නැගෙනහිරට : ඩී. යූ. එච්. හඳුවල හිමිකම් කියන මෙම ඉඩමේ ඉතිරි කොටස ද, දකුණට : ඩී. යූ. එච්. හඳුවල හිමිකම් කියන මෙම ඉඩමේ ඉතිරි කොටස ද, බස්නාහිරට : කැබලි අංක බී (රක්ෂිතය), ප්‍රවේශ මාර්ගය ද, යන මායිම් තුළ පිහිටි රූඩ් එකයි පර්චස් නමයක් (රූඩ් 01, පර්.09) විශාල ඉඩම සහ ඒ තුළ පිහිටි ගොඩනැගිලි, ගහකොළ, පළතුරු ආදී සියළුම දේද ඉහත කී අංක 6562 පිඹුරේ කැබලි අක්ෂර බී දරන පර්චස් 8.14ක් විශාල ඉඩම් කොටසෙහි මාර්ග පරවශ්‍යතා අයිතිය ද ඇතුළුව මෙම ඉඩමට යාමට සහ ඒමට ඇති සියළුම මාර්ගයන්හි මාර්ග පරවශ්‍යතා අයිතිය ද සමග වේ.

ඉහත ඉඩම පහත දැක්වෙන ඉඩමේ නැවත මැනීමකි.

සබරගමුව පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, කොළොන්න කෝරළේ, දියපොතගම් පත්තුවේ, ඇඹිලිපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ඇඹිලිපිටිය නගර සභා සීමාව තුළ, පල්ලෙගම ග්‍රාම නිලධාරි වසමේ, ඇඹිලිපිටිය පල්ලෙගම ගමේ පිහිටි "බිම්බදූයාය" නැමති ඉඩමට අවසරලත් මානක ජී. ඩබ්. කේ. මනම්පේරි මහතා විසින් මැන සම්පාදිත අංක 1222 සහ 2000.07.05 දිනැති පිඹුරේ සඳහන්,

උතුරට : ටී. ඩී. ප්‍රේමදාස සහ කේ. සයිමන් සිංඤෝ හිමිකම් කියන ඉඩම ද, නැගෙනහිරට : එම්. ආරොං සිංඤෝ හිමිකම් කියන ඉඩම ද, දකුණට : ආරොං සිංඤෝ සහ එම්. සිරිපාල හිමිකම් කියන ඉඩම ද, බස්නාහිරට : ප්‍රවේශ මාර්ගය (ඇල රක්ෂිතය) ද, යන මායිම් තුළ පිහිටි රූඩ් එකයි පර්චස් නමයක් (රූඩ් 01, පර්. 09)ක විශාල ඉඩම සහ ඒ තුළ පිහිටි ගොඩනැගිලි, ගහකොළ, පළතුරු ආදී සියළුම දේද වේ.

මෙය දැනට ඇඹිලිපිටිය ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ L 27/128 දරන පත්‍රිරුව යටතේ ලියාපදිංචි වී ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ප්‍රාදේශීය කළමනාකරු,
රත්නපුර.

මහජන බැංකුව,
ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය,
නව නගරය - රත්නපුර.

08 - 126

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.